

2021

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

நவீன தொழில்நுட்பவியலுக்கான ஆர்தர் சி. கிளார்க் நிறுவகம்.

Arthur C. Clarke Institute for Modern Technologies.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
වාර්ෂික වාර්තාව 2021

පටුන		පිටු අංකය
1.0	සාමාන්‍ය තොරතුරු	1
	1.1 පාලන ව්‍යවස්ථාව	1
	1.2 ඉදිරි දැක්ම	1
	1.3 මෙහෙවර	1
	1.4 පාලනය කරන අමාත්‍යාංශය	1
	1.5 පාලක මණ්ඩල සාමාජිකයින් - 2021	2
2.0	විධායක සාරාංශය	3
3.0	ආයතනයේ අංශ	6
4.0	ප්‍රධාන ව්‍යාපෘතිවල කාර්යසාධනයේ විශේෂ අවස්ථා	7
5.0	පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණික සේවාවන්	13
	5.1 කර්මාන්ත සඳහා ආරම්භකර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	13
	5.2 ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති	13
	5.3 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති	18
	5.4 දුරස්ථ සංවේදනය (RS) හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති	20
	5.5 පෘථිවි නිරීක්ෂණ වන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම	22
	5.6 පර්යේෂණ ප්‍රකාශන හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම	22
	5.7 පරීක්ෂා කිරීම් හා මිනුම්, දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශන සේවා	23
6.0	පුහුණු අධ්‍යාපන හා තොරතුරු බෙදාහැරීම	26
	6.1 වෘත්තිකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්	26
	6.2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු	26
	6.3 විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රිය කරවීම් හා තොරතුරු බෙදාහැරීම සහ තාරකා විද්‍යාව හා අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කරවීමේ වැඩසටහන්	27
	6.4 ACCIMT පුස්තකාලය	28
7.0	මානව සම්පත් සංවර්ධනය	30
8.0	2021 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන	32
9.0	සැලසුම්කරන ලද කෙටි හා මධ්‍ය කාලීන වැඩසටහන්	57
10.0	2021 වසර සඳහා විගණකාධිපති වාර්තාව	59
11.0	2021 වසර සඳහා විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	66

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
කටුබැද්ද,
මොරටුව.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
පර්යේෂණ හා නව නිපැයුම් අංශය ,
3 වන මහල, සෙත්සිරිපාය පළමු අදියර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාල සීමාව සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව.

2013 අංක 32 දරණ පනත මගින් සංශෝධිත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ VII කොටසේ 40 වන වගන්තියට අනුකූලව පහත සඳහන් ලේඛනද සමගින් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2021 වසර සඳහා වන වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ගෞරවයෙන් ඉදිරිපත් කරමි

(අ) විගණනය කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිටපතක්

(ආ) විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පිටපතක්

(ඇ) විගණකාධිපති වාර්තාව හා ඒ පිළිබඳව ආයතනයේ නිරීක්ෂණ

මීට විශ්වාසී,

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

1.0 සාමාන්‍ය තොරතුරු

1.1. පාලන ව්‍යවස්ථාව

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) අධ්‍යාපන අමාත්‍යාංශය, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත සංස්ථාවකි. 1984 අංක 30 දරණ පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් 01 වන දින නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය ස්ථාපනය කර ඇත.

පනතේ දක්වා ඇති පරිදි නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ කාර්යභාරය පහත දැක්වේ:

(අ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා
- (i) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන්, ප්‍රවර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාම මගින්
- (ii) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා රජයට සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට පර්යේෂණ හා සංවර්ධන සහය සැලසීම මගින්
- (iii) රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාරයන්හි අවශ්‍යතාවය පිරිමසාලීම සඳහා නවීන තාක්ෂණ සම්බන්ධයෙන් පුද්ගලයින් පුහුණු කිරීම මගින් දායකවීම

(ආ) අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා

නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යා, ෆොටෝනික්ස් සහ නව ද්‍රව්‍ය ඇතුලත් වේ.

1.2. ඉදිරි දැක්ම

නවීන තාක්ෂණය සඳහා කලාපය තුළ ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම

1.3. මෙහෙවර

දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන්, නවෝත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුණු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගීතා තුලින් සංවර්ධනය හා දිරිමත් කිරීමට පහසුකම් සැලසීම.

1.4. පාලනය කරන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශය, පර්යේෂණ හා නව නිපැයුම් අංශය.

1.5. පාලක මණ්ඩල සාමාජිකයන් – 2021

1.	මහාචාර්ය සිසිල් කුමාරවඩු	පාලක මණ්ඩල සභාපති
2.	ඉංජිනේරු සනත් පනාවැන්නගේ	අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි, පාලක මණ්ඩල සාමාජික
3.	මහාචාර්ය කේ.පී.එස්. චන්දන ජයරත්න	පාලක මණ්ඩල සාමාජික
4.	මහාචාර්ය එන්.ඩී.ගුණවර්ධන	පාලක මණ්ඩල සාමාජික
5.	මහාචාර්ය ඒ.කේ.ඩබ්.ජයවර්ධන	පාලක මණ්ඩල සාමාජික
6.	මෙරික් ගුණරත්න මහතා	පාලක මණ්ඩල සාමාජික
7.	රාජිත දහනායක මහතා	පාලක මණ්ඩල සාමාජික
8.	සුෂේන රණතුංග මහතා	පාලක මණ්ඩල සාමාජික
9.	මහාචාර්ය එස්.ඒ.අරියදුරෙයි	පාලක මණ්ඩල සාමාජික
10.	උදේනි උඩුගහපත්තුව මිය	පාලක මණ්ඩල සාමාජික
11.	මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා	පාලක මණ්ඩල සාමාජික

2021 වසරේදී පවත්වනු ලැබූ පාලක මණ්ඩල රැස්වීම්

පාලක මණ්ඩල රැස්වීම් අංකය	රැස්වීම් පැවැත්වූ දින
2021/01	2021/01/26
2021/02	2021/02/23
2021/03	2021/03/23
2021/04	2021/04/27
2021/05	2021/06/30
2021/06	2021/07/27
2021/07	2021/10/26
2021/08	2021/11/23
2021/09	2021/12/28

2. විධායක සාරාංශය

සමාලෝචනයට ලක්වන කාලය තුළ මූලිකවම, පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අහිතකර සමාජ ආර්ථික හා පාරිසරික තත්වයන් යටතේ වුවද, ආයතනයට විශේෂිත පුළුල් තාක්ෂණික විෂය පථයට අදාල ජාතික ධාරිතාවන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන අතරම පර්යේෂණ හා සංවර්ධන, තාක්ෂණික සේවාවන් හා පුහුණු හා උපදේශන සේවාවන් ඇතුළු ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට ACCIMT ආයතනයට හැකි විය.

රටේ අභ්‍යවකාශ තාක්ෂණ ධාරිතා සංවර්ධනය සඳහා ජාතික වශයෙන් වගකීම පැවරී ඇති ආයතනය වශයෙන් සිය කාර්යයන් ඉටුකිරීමේදී ආයතනය නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍රයේ ලබා ඇති ජයග්‍රහණයන් කේන්ද්‍රකර ගනිමින් ජාත්‍යන්තර හවුල්කරුවන් සමග ආයතනය ආරම්භකර ඇති තාක්ෂණික සහයෝගීතාවන් අඛණ්ඩව සිදුකරගෙන යනු ලැබීය. වසර තුළදී ජපානයේ කියුෂූ තාක්ෂණ ආයතනය (Kyutech) හා ජපානයේ හා සිංගප්පූරුවේ තවත් සහයෝගිතා ආයතන තුනක් සමගින් පස්-පාර්ශවීය ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සිදුකරන KITSUNE නම් සය ඒකක උසස් නැනෝ චන්ද්‍රිකාව සැලසුම් කිරීම, වැඩි දියුණු කිරීම හා පරීක්ෂා කිරීම සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතියේ ස්ථාවර ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි විය.

මෙම නැනෝ චන්ද්‍රිකාව 5m විභේදනයන් සහිත පෘථිවි නිරීක්ෂණ, චන්ද්‍රිකා පාදක IOT, අයනගෝලීය සංවේදක, අධිවේගී සන්නිවේදන හා ප්‍රමිතියෙන් යුත් ඝනක චන්ද්‍රිකාවේ බඳ යන අංග 5කින් සමන්විත වන අතර මේ සඳහා අප ආයතනයේ ඉංජිනේරුවන් මූලික වශයෙන් දායක වේ. චන්ද්‍රිකාව කක්ෂගත කළ විට එහි පර්යේෂණ හැකියාවන් සඳහා පූර්ණ වශයෙන් ප්‍රවේශවීමේ හැකියාව හිමිවන අතර එමගින් ඉතා ඉහල ප්‍රාග්ධන ආයෝජනයක් මගින් පමණක් ලබාගත හැකි රටේ අභ්‍යවකාශ තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් තාක්ෂණ හැකියාවන්හි සමස්ත පදනම වැඩිදියුණු කරන අතරම මෙම ව්‍යාපෘතිය මගින් ACCIMT ඉංජිනේරුවන්ට බෙහෙවින් අවශ්‍ය ප්‍රායෝගික දැනුමට නිරාවරණය වීමේ අවස්ථාව සැලසුණි. විශේෂයෙන්ම ACCIMT මගින් ප්‍රාග්ධන වියදමක් නොමැතිව ආයතනයේ ඉංජිනේරුවන්ගේ තාක්ෂණික දායකත්වය පමණක් ලබාදීමේ පදනම මත සහයෝගිතා හවුල්කරුවකු වීමට අප ආයතනය සාර්ථකව සාකච්ඡා කරනු ලැබීය.

මෙම කාලය තුළ සේවාලාභී අවශ්‍යතාවන් සඳහා UAV යානා ගණනාවක් නිර්මාණය කර වැඩිදියුණු කිරීම මගින් මෙම අභියෝගාත්මක වාතාවරණය යටතේ ඩ්‍රෝන තාක්ෂණය හා සම්බන්ධ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගැනීමට ආයතනය සමත් විය. ගවේක්ෂණය සඳහා භාවිතා කිරීම අරමුණු කරගත් අවම ඉඩක ගුවන් ගත කිරීම හා ගොඩබෑම සිදුකළ හැකි, යානාවක් සාර්ථක ලෙස වැඩිදියුණු කිරීම සමාලෝචිත වර්ෂයේ කැපී පෙනෙන ජයග්‍රහණයකි. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන කාර්යාලය මගින් අරමුදල් සපයන ලද විශේෂ වැඩසටහනක් යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශේෂ බෝට්ටු භට කණ්ඩායම සඳහා ACCIMT ආයතනය විසින් නිපදවන ලද ඩ්‍රෝන යානා දෙකක් සැපයීම ද සුවිශේෂී ජයග්‍රහණයකි.

පෙර වසරේ සිට සිදුකරන තවත් වැදගත් කාර්යක් වන්නේ ස්කැන්ඩිනේවියානු රටවල් සඳහා අපරාධයන්ට එරෙහි පුද්ගල ආරක්ෂක/අනතුරු ඇඟවීමේ උපකරණයක් නිර්මාණය කර වැඩිදියුණු කිරීම වේ. සුදුසුකම් සපුරාලීමේ ක්‍රියාවලිය තුළ මුහුණ දුන් අභියෝගයන් සාර්ථක ලෙස මැඩපවත්වමින් එම නිෂ්පාදනය අදාල යුරෝපීය ප්‍රමිතීන්ට අනුකූලබව තහවුරු කරමින් ‘CE’ (European Conformity) ලකුණ ලබාගැනීමට සමත්විය.

අදාල SLS ප්‍රමිතීන්ට අනුව මෝටර් සයිකල් හා මෝටර් රථ බැටරි පරීක්ෂා කිරීම සඳහා ධාරිතා ටෙස්ටරයක් (C10 හා C20) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම ආරම්භ කිරීම මගින් රටේ අපනයන අරමුණු කරගත් විශේෂ අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් වන ආයතනයේ කැපවීම පෙන්නුම් කෙරේ. සමාලෝචිත වර්ෂයේදී විද්‍යාගාර මූලාකෘතිය නිමකර ඇති අතර ක්‍රමාංකනය හා ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් නිමකළ යුතුව ඇත.

2021 වසර තුළ අඛණ්ඩව සිදුකරන ලද තවත් එක් ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් වන්නේ Xilinx FPGA තාක්ෂණය පදනම් කරගත් තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතියයි.

දුරස්ථ සංවේදන හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ක්ෂේත්‍රයේ දැනට සිදුකරන ව්‍යාපෘතියක් වන "වී අස්වැන්න පුරෝකථනය හා වී වගාකරන ලද බිම් ප්‍රදේශය හඳුනාගැනීම" 2021 වසරේ යල කන්නය සඳහා ප්‍රධාන වී වගාකරන දිස්ත්‍රික්ක ආවරණය වන ලෙස තවදුරටත් පුළුල් කරනු ලැබීය. වී අස්වැන්න පුරෝකථනය කිරීම සඳහා MODIS චන්ද්‍රිකාවෙන් ලබාගන්නා ලද චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් මොඩලයක් වැඩිදියුණු කරන ලද අතර ප්‍රතිඵල ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු සත්‍ය දත්ත සමග සත්‍යාක්ෂණය කළ යුතුව ඇත. විවෘත ප්‍රවේශ චන්ද්‍රිකා දත්ත භාවිතයෙන් ශ්‍රී ලංකාවේ වන ආවරණ ආකාරය සිතියම්ගත කිරීම හා GIS හා සිතියම් විද්‍යාව භාවිතයෙන් කොවිඩ්-19 වසංගත විද්‍යාව ඇගයීමේ ක්‍රමය දුරස්ථ සංවේදන/GIS ක්ෂේත්‍රයේ සිදුකරන ලද තවත් ව්‍යාපෘතීන් වේ.

වසර තුළ තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදුකරන ලද කාර්යයන්ට කාලගුණ අධීක්ෂණය සඳහා ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන මගින් එකතු කරගත් සංවේදක දත්ත ප්‍රදර්ශනය සඳහා වෙබ් පාදක අතුරු මුහුණතක් වැඩිදියුණු කිරීම, විශේෂිත යෙදවුම් සඳහා ජංගම දුරකථන යෙදවුම් ගණනාවක් වැඩිදියුණු කිරීම සහ තොරතුරු පද්ධති කිපයක් වැඩිදියුණු කිරීම අයත් වේ.

ආයතනය ද්විත්ව තාරකා පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය, ඩෙල්ටා ස්කූටි ආකාර තාරකාවල වර්ණාවලික්ෂ අන්වේක්ෂණ (Asteroseismology - තාරකා මගින් ඇතිකරණ දෝලනේක්ෂයන්හි විවිධ සංඛ්‍යාත විශ්ලේෂණය කිරීමේ ක්‍රමය) , e-CALLISTO ජාලය සඳහා දිගු තරංග ඇන්ටනා පද්ධතියක් ඉදිකිරීම යන තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ව්‍යාපෘති තුනක් සිදු කරනු ලැබීය. ඉන් එක් පර්යේෂණ ප්‍රතිඵලයක් ඇමරිකානු තාරකා විද්‍යා සංගමයේ සඟරාවේ පළකරනු ලැබීය.

වසංගතය හමුවේ ඇතිවූ අයහපත් තත්වයන්ට සාර්ථකව මුහුණදෙමින් ඉලෙක්ට්‍රොනික පරීක්ෂා කිරීමේ හා මැනුම් උපකරණ ක්‍රමාංකනය කිරීම, ලෙඩ් අම්ල බැටරි, සර්ජ් ආරක්ෂක උපකරණ, LED හා CFL විදුලි පහන් ඇතුළු විවිධ ආකාරයේ ඉලෙක්ට්‍රොනික උපකරණවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම හා සේවාලාභී ඉල්ලීම් අනුව සිදුකළ වෙනත් කාර්යයන් ඉටුකිරීම මගින් ආයතනය කාර්මික සේවාලාභීන් සඳහා සිය සේවාවන් සැපයීම අඛණ්ඩව පවත්වා ගැනීමට සමත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සැළකිය යුතු සංඛ්‍යාවක උපදේශන හා දෘඩකාංග යථාතත්වයට පත්කිරීමේ සේවාවන් වලට අමතරව ආයතනය විසින් වසර තුළ කාර්යසාධනය පරීක්ෂා කිරීමේ වාර්තා 236 හා ක්‍රමාංකන වාර්තා 83ක් නිකුත් කරන ලදී.

අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් හා වෙනත් පුහුණු වැඩසටහන් හා විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රිය කිරීමේ වැඩසටහන් වසංගතය හේතුවෙන් වඩාත් බලපෑමට ලක්වූ ක්‍රියාකාරකම් වන අතර වෘත්තිකයින් 85 දෙනෙක් සඳහා CCTV ආරක්ෂක පද්ධති (ELV) ආකෘතිය, ස්ථාපනය හා නඩත්තු කිරීම, වැඩසටහන්ගත කළ හැකි ලොජික් පාලන පද්ධතිය හා නවීන ඩිජිටල් ඉලෙක්ට්‍රොනික පරීක්ෂා කිරීමේ හා මැනුම් උපකරණ යන CPD වැඩසටහන් තුනක් සහ රොබොටික් පිළිබඳ වැඩමුළුව හා ප්‍රායෝගික තාරකා විද්‍යාව සඳහා හඳුන්වාදීමේ වැඩමුළුව යන මූලික හා මධ්‍යම මට්ටමේ පුහුණු වැඩසටහන් දෙකක් ද පවත්වනු ලැබීය.

මූලික වශයෙන්ම පාරිතෝෂික ප්‍රමාණවත් නොවීම, හා ප්‍රතිඵල මත නොව පටිපාටික අනුකූලතාවන් අරමුණු කරගත් අවශ්‍යතාවන්ට අනුව කටයුතු කිරීම, බාහිරින් දක්වන ලද පොදු පරිපාලනමය පාලන අවශ්‍යතාවන් හේතුවෙන් ආයතනය සඳහා ප්‍රධාන තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා රඳවාගැනීමේ අපහසුතාවය හේතුවෙන් වන අඛණ්ඩ බලපෑම් වලට ලක්වෙමින් වුවද සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ එහි සමස්ත කාර්යසාධනයෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලඟාකරගෙන ඇති බව සඳහන් කළ යුතුය.

ඉන්ජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරි
(පාලක මණ්ඩල සාමාජික)

3. ආයතනයේ අංශ

- ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය
- සන්නිවේදන අංශය/රොබෝ විද්‍යා අංශය
- කාර්මික සේවා අංශය
- අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් /අභ්‍යවකාශ තාක්ෂණ අංශය/තාරකා විද්‍යා අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් අංශය

4. ප්‍රධාන ව්‍යාපෘතිවල කාර්යසාධනයේ විශේෂ අවස්ථා

6U නැනෝ චන්ද්‍රිකාව වැඩිදියුණු කිරීම හා KITSUNE සමග ධාරිතා ගොඩනැගීම

අභ්‍යවකාශ විද්‍යා අංශයේ ඉංජිනේරුවන්ගේ හැකියාවන් තවදුරටත් වර්ධනය කිරීම සඳහා 2020 වසරේදී KITSUNE, 6U නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. මෙම චන්ද්‍රිකාව 5m විභේදනයක් සහිත පෘථිවි නිරීක්ෂණ, චන්ද්‍රිකා පාදක IOT, අයනගෝලීය සංවේදක, අධිවේගී සන්නිවේදන හා ප්‍රමිතියෙන් යුත් සනක චන්ද්‍රිකාවේ බඳ යන අංග 5කින් සමන්විත වන අතර සාර්ථක පර්යේෂණ, වැඩිදියුණු කිරීම් හා පරීක්ෂා කිරීම් වලින් පසුව දැන් දියත් කිරීම සඳහා සූදානම්ව පවතී. කියුෂු තාක්ෂණ ආයතනය, නැන්යැං තාක්ෂණික විශ්වවිද්‍යාලය, Harada Seiki Inc. (ජපාන කාර්මික හවුල්කරු), Addnics Inc. (ජපාන කාර්මික හවුල්කරු) සහ ACCIMT මෙම ව්‍යාපෘතියේ හවුල්කරුවන්වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල ලෙස පුළුල් පරාසයක දුරස්ථ සන්වේදන යෙදවුම් සඳහා යොදාගත හැකි 5m විභේදනයන් සහිත චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීමට හැකිවනු ඇත. තවද, චන්ද්‍රිකා සන්නිවේදන සම්බන්ධතාව හරහා කැමති ස්ථානයක සිට දුරස්ථ පිහිටීම්වල (වන ජීවී අභයභූමි, විදුලි බලාගාර ආශ්‍රිත ජල ප්‍රදේශ, ජංගම කාලගුණ මධ්‍යස්ථාන වැනි) ජල මට්ටම, කාලගුණ හෝ පාරිසරික දත්ත ලබාගැනීමට හැකිවනු ඇත. භෞමික මෙහෙයුම් හා සන්නිවේදනය සඳහා දුරස්ථ ස්ථානයන්හි වෙන්ව පිහිටි භෞමික සන්වේදී පර්යන්තයන් (Ground Sensor Terminals) මෙහෙයුම් කළ යුතුය.

KITSUNE නැනෝ චන්ද්‍රිකාව සඳහා ACCIMT දායකත්වය සපයන ලද උප පද්ධතීන් පහත දැක්වේ.



OBC පුවරුව



LoRa පුවරුව





UHF COM පුවරුව



EPS පුවරුව

උප පද්ධති

- චන්ද්‍රිකාවේ ඇති පරිගණකය (OBC)
- UHF සන්නිවේදන උපකරණ (UHF COM)
- දිගු පරාසයක අඩු ප්‍රභල සන්නිවේදන (LoRa)
- විදුලි බල සැපයුම (EPS)

චන්ද්‍රිකාව තුළ අන්තර්ගත දෑ (Payloads)

- SPATIUM 1U Side OBC පුවරුව නිර්මාණය කිරීම හා වැඩසටහන්ගත කිරීම (OBC – චන්ද්‍රිකාවේ ඇති පරිගණකය. Brain of the SPATIUM side)
- LoRa පුවරුව නිර්මාණය කිරීම හා වැඩසටහන්ගත කිරීම (මෙම පුවරුව මගින් භෞමික සංවේදන පර්යන්තය මගින් දත්ත එක් රැස් කෙරේ)
- SPATIUM side UHF සන්නිවේදන පුවරුව වැඩසටහන්ගත කිරීම (මෙම පුවරුව SPATIUM පැත්තේ ප්‍රධාන ප්‍රතිග්‍රාහකය වන අතර එය දුරස්ථ දත්ත යැවීම හා එයට සබැඳි නියෝග ලබා ගැනීම සඳහා භාවිතා කෙරේ)
- CSAC මෙහෙයුම් දත්ත හා වැඩසටහන්ගත කිරීම් පාලනය කිරීම (CSAC – Chip Scale Atomic Clock)
- SPATIUM පැත්තේ EPS පාලනය කිරීම හා වැඩසටහන්ගත කිරීම.
- EPS - විදුලිබල සැපයුම් පද්ධතිය

KITSUNE හි මූලික මෙහෙයුම් යෙදවුම්

ආයතනයේ ඉංජිනේරු කණ්ඩායමේ ධාරිතා ගොඩනැගීමේ මූලික අරමුණ සපුරාලන අතරම KITSUNE නැනෝ චන්ද්‍රිකාවට ප්‍රධාන යෙදවුම් දෙකක් ඇත. එනම් දුරස්ථ දත්ත (චන්ද්‍රිකා සබැඳි පාදක රැහැන් රහිත සන්නිවේදන) රැස්කිරීම සඳහා භෞමික සංවේදී පර්යන්තය (GST) හා ගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ව්‍යාපෘතියට අදාල ඡායාරූප ලබාගැනීම සඳහා චන්ද්‍රිකාවේ ඇති 5m විභේදනයන් සහිත කැමරාව වේ.





භෞමික සංවේදී පර්යන්තය (GST)

දුරස්ථ පිහිටුමක වෙන්ව පිහිටි දත්ත රැස්කිරීමේ පර්යන්ත GST මගින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට වෙනත් ව්‍යාපෘතියක් ලෙස දුරස්ථ සංවේදී දත්ත සන්නිවේදන හා ගුවන් විදුලි සංඛ්‍යාත මෘදුකාංග වැඩිදියුණු කිරීම් නිමකර ඇත.







යුරෝපීය රටවල් සඳහා අපරාධයන්ට එරෙහි පුද්ගල ආරක්ෂක/ අනතුරු ඇඟවීමේ උපකරණය

මෙය ස්කැන්ඩිනේවියානු රටවල් සඳහා නිපදවූ නිවසින් බැහැර පරිසරයේදී කාන්තාවන්ට එරෙහි අපරාධ වැලැක්වීමට උපකාරීවන උසස් ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පදනම් පුද්ගල ආරක්ෂක උපකරණයකි. මෙම ව්‍යාපෘතිය මගින් නවීන තාක්ෂණික, ක්ෂුද්‍රරූපී, උසස් ඉලෙක්ට්‍රොනික නිෂ්පාදනයක් නිර්මාණය කිරීම සිදුකරන අතර අපගේ සේවාලාභියා ගෝලීය වෙළඳපලක් ඇති අපනයන ඉලක්කකර ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන/ උප එකළස් කිරීම සඳහා නිෂ්පාදන කරන සමාගමක්වේ. මෙම නිෂ්පාදනය LED තීරයක් සහිත ඉන පටියක්, අතේ තබාගන්නා අනතුරු ඇඟවීමේ එලාමයක් හා ස්මාට් දුරකතනයක් යන මූලික කොටස් තුනකින් සමන්විත වන අතර LED තීරයක් සහිත ඉන පටියක්, අතේ තබාගන්නා අනතුරු ඇඟවීමේ එලාමය යන කොටස් දෙක ACCIMT ආයතනය විසින් නිර්මාණය කර වැඩිදියුණු කළ යුතුවේ.



දැඩි ලෙස ප්‍රමිතිය සළකා බලන යුරෝපීය වෙළඳපල සඳහා පිළිගනු ලබන නිෂ්පාදනයක් නිර්මාණයකර වැඩිදියුණු කිරීමේදී මුහුණදෙන අභියෝග ගණනාවක් මධ්‍යයේ, සේවාලාභියා විසින් බොහෝ වාරයක් වෙනස්කරන ලද දැඩි පිරිවිතරයන්ට අනුගත වෙමින් මූලික කාර්යයන් සාර්ථකව නිමකර ඇත. නිෂ්පාදනය යුරෝපීය සෞඛ්‍යය, සුරක්ෂිත හා පාරිසරික ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කරමින් CE ලකුණ මගින්ද සහතික කරනු ලැබීය. ඊට අමතරව සළකා බලන වසර තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස IP 65 ආරක්ෂක ප්‍රමිතීන්ට අන්කූලව PCB සඳහා වැඩිදියුණු කිරීම් සිදුකරන ලද තවත් ඒකක 05ක් හා අතේ තබාගන්නා ඒකකය සඳහා ඇසුරුමක් නිෂ්පාදනය කිරීම හා පරීක්ෂා කිරීම ඇතුලත්වේ. මෙම ඒකක 05 දේශීය නිෂ්පාදන සමාගම හා ස්වීඩන පාර්ශවය විසින් ලබාදෙනු ලැබූ පිරිවිතරයන්ට අනුව ක්‍රියාත්මක කිරීම තහවුරු කරන ලදී. TOS Lanka සමාගමේ නිෂ්පාදන පහසුකමෙහිදි තවත් ඒකක 100ක් නිෂ්පාදනය කර ඇති අතර ස්වීඩන් සේවාලාභියා වෙත යැවීමට පෙර ACCIMT හිදී වැඩසටහන්ගත කිරීම හා පරීක්ෂා කිරීම සිදුකරන ලදී.







භ්‍රමණ තල හතරක් සහිත අන්වේක්ෂක UAV

ශ්‍රී ලංකා නාවුක හමුදාවේ විශේෂ බෝට්ටු කණ්ඩායම සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන (UNODC/UNOPS) යටතේ මූලිකවම මගපෙන්වීමේ හා හැකියාවන් පවත්වා ගැනීම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කාර්යයන්හිදී භාවිතා කිරීමට ඩ්‍රෝන යානා දෙකක් පරිත්‍යාග කරනු ලැබීය. ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රියාවලිය හරහා ACCIMT විසින් නිපදවන ලද ඩ්‍රෝන යානා දෙකක් සැපයීම සඳහා මෙම ටෙන්ඩරය ලබාගැනීමට හා ශ්‍රී ලංකා නාවුක හමුදාවට අවශ්‍ය පුහුණුව හා නඩත්තු සේවා සැපයීමට ACCIMT ආයතනයට හැකි විය.





සිරස්ව ගුවන්ගත කරන හා ගොඩබාන (VTOL-UAV)

විස්තීර්ණ පර්යේෂණ හා නිර්මාණ ක්‍රියාවලියකින් පසුව විශේෂයෙන්ම වෙරළබඩ අන්වේෂණ යෙදවුම් ඉලක්කකර සීමිත ඉඩකදී ගුවන්ගත කිරීම හා ගොඩබෑම සිදුකළ හැකි UAV යානයක් නිර්මාණය කිරීමට ACCIMT ආයතනයට හැකිවිය. මූලාකෘති නිර්මාණය කිරීමේ කාර්යය 2020 වසරේදී ආරම්භ කරන ලද අතර නිෂ්පාදනය පරීක්ෂා කිරීම 2021 වසර තුළ නිම කරන ලදී. මෙම UAV ආවේක්ෂණ යෙදවුම් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන අතර ශ්‍රී ලංකා නාවික හමුදාව සමග සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස භාවිතා වනු ඇත.

ආවේක්ෂණ යෙදවුම් වලදී VTOL-UAVහි උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා එයට ආවරණය/පැවැත්ම පුළුල් කිරීම හා උසස් ප්‍රමිතියෙන් යුත් ඡායාරූප ගැනීමේ උපකරණ ඇතුලත් කළ යුතුය. ඉහත උපාංග අවශ්‍යතාවය ඉතා මිල අධිකය. මෙම ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතිය සඳහා එම අයිතම මිලට ගැනීමට එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මගින් අරමුදල් ලබාගැනීමට හැකිවූ අතර එමගින් ශ්‍රී ලංකාවේ තාක්ෂණික වැඩිදියුණු කිරීමේ හැකියාවන් පෙන්නුම් කෙරේ. මෙම අයිතම ශ්‍රී ලංකා නාවුක හමුදාව මගින් ලැබිය යුතු අතර ව්‍යාපෘතිය අඛණ්ඩව සිදුකිරීම සඳහා 2022 වසර මුලදී ACCIMT ආයතනයට භාරදෙනු ඇත.




බැටරි පරීක්ෂා කිරීම සඳහා ධාරිතා ටෙස්ටරය වැඩිදියුණු කිරීම

ප්‍රමුඛ දේශීය බැටරි නිෂ්පාදන හා අපනයන සමාගමක් සඳහා SLS ප්‍රමිතියට අනුව මෝටර් සයිකල් හා වාහන බැටරි පරීක්ෂා කිරීම සඳහා ධාරිතා ටෙස්ටරයක් (C10 හා C20) සැලසුම් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියකි. අප සේවාලාභියා මෝටර් සයිකල් හා වාහන බැටරි පරීක්ෂා කිරීම සඳහා අංගසම්පූර්ණ පරීක්ෂා කිරීමේ පහසුකමක් ඉදිකිරීමේ කාර්යයයේ නියලී සිටී. අදාල ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව ධාරිතා ටෙස්ටරය සැලසුම් කර ඇති අතර එය පැය 10 හා පැය 20 කාල පරාසයකදී බැටරියේ ගබඩා වී ඇති ආරෝපණ සත්‍යෝක්ෂණය සඳහා භාවිතා කෙරේ. පර්යේෂණාගාර මූලිකෘතිය නිමකර ඇති අතර ක්‍රමාංකනය කිරීම් හා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකළ යුතුව ඇත.





ප්‍රධාන වී වගාකරන දිස්ත්‍රික්කයන්හි වී අස්වැන්න පුරෝකථනය කිරීම හා වී වගාකර ඇති ප්‍රදේශය හඳුනා ගැනීම

වී වගාකර ඇති ඉඩම්වල වපසරිය නිර්ණය කිරීම සඳහා චන්ද්‍රිකා ඡායාරූප මත පදනම් මොඩලයක් යොදාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය මගින් යෝජනා කරන ක්‍රමය එක් වර්ගයකින් සමන්විත ඕනෑම වගාවක් හඳුනා ගැනීම සඳහා යොදාගත හැකිය. අස්වැන්න පුරෝකථනය කිරීමේ මොඩල ගොඩනැගීම සඳහා රේඛිය මොඩල භාවිතා කළ හැකි අතර අස්වැන්න පුරෝකථනය කිරීම සඳහා වඩාත් සුදුසු කාලය කන්නයේ ඉහලම ඵලදාව ලබාදෙන කාලයයි.

“වී අස්වැන්න පුරෝකථනය කිරීම හා වී වගාකර ඇති ප්‍රදේශය හඳුනා ගැනීම” නියමු අධ්‍යයනය සඳහා අම්පාර දිස්ත්‍රික්කය තෝරාගෙන ඇති අතර එය 2018 යල කන්නය සඳහා සාර්ථකව සිදුකරනු ලැබීය. අඩු අවකාශ විභේදනයක් නමුත් ඉහල ටෙම්පෝරල් විභේදනයක් සහිත MODIS චන්ද්‍රිකා දත්ත (GSD 250m, දින 8) භාවිතයෙන් මෙට්‍රික් ටොන් 205,680ක වී අස්වැන්න ගණනය කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය සඳහා භාවිතාකරන ලද ක්‍රමය මහා පරිමාණ වී වගාකරන දිස්ත්‍රික්ක සඳහා වෙන් වශයෙන් යොදාගනු ලැබීය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගාකරන දිස්ත්‍රික්කයන්හි (උදා. පොලොන්නරුව, අම්පාර, මඩකලපුව, හම්බන්තොට, අනුරාධපුරය හා ත්‍රිකුණාමලය) 2021/යල කන්නය සඳහා මෙම ව්‍යාපෘතිය සම්පූර්ණකර ඇත.

දිස්ත්‍රික්කය	පුරෝකථනය කරන ලද අස්වැන්න (කි.ග්‍රෑ/හෙක්ටයාර)	වගාකරන ලද ප්‍රදේශය (හෙක්ටයාර)	මුළු අස්වැන්න (මෙ.ටොං)
අම්පාර	4968	60208	299097
පොලොන්නරුව	5103	61023	311381
මඩකලපුව	2928	29438	86183
ත්‍රිකුණාමලය	5007	26392	132141
හම්බන්තොට	5953	26806	159587
අනුරාධපුරය	4498	45264	203606





5.0 පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණික සේවාවන්

5.1 කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

තේ වතු සඳහා යථාතත්ව කෘෂිකර්මාන්තය, කෘෂි කාලගුණ විද්‍යා කාලගුණ මධ්‍යස්ථාන

2020 වසර තුළදි තේ පර්යේෂණ ආයතනය සඳහා සිදුකරන ලද ඒ හා සමාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී ලගාකරගත් සාර්ථකත්වය පදනම්කර ගනිමින් 2021 වසරේදී නකල්ස්, හෝර්ටන් තැන්න හා සිංහරාජ යන ස්ථානයන්හි නව පද්ධති තුනක් ස්ථාපනයකර ක්‍රියාත්මක කරනු ලැබීය. තේ වගාකරන ප්‍රදේශයන්හි ඇග්‍රිසෙල් (Agricell) සඳහා දත්ත අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම නව පද්ධති වලට අමතර දත්ත එකතු කිරීමේ පහසුකම් ඇතුලත්කර ඇත.
මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ තේ වතු ඇති ප්‍රදේශයන්හි දේශගුණය අධීක්ෂණය, ආදර්ශ සැකසීම හා පුරෝකථනය කිරීම හා කාබන් වායුව, නයිට්‍රස් වායුව හා පසේ තෙතමනය හා පසේ උෂ්ණත්වය සමගින් තේ ශාකයේ වර්ධක තත්වයන් අධීක්ෂණය කිරීමවේ.

ස්වාධීනව ක්‍රියාත්මක පද්ධතීන්හි තත්කාලීනව අධීක්ෂණය කරන පරාමිතීන්,

- වර්ෂාපතනය, වායු උෂ්ණත්වය, ආර්ද්‍රතාව, සුළගේ දිශාව, සුළගේ වේගය
- UV මට්ටම, ආලෝක මට්ටම, පසේ තෙතමනය, පසේ උෂ්ණත්වය, වායු ඇමෝනියා මට්ටම
- කාබන් ඩයොක්සයිඩ්, නයිට්‍රස් ඔක්සයිඩ්, ඇමෝනියා, කාබන් මෙනොක්සයිඩ්

යථාතත්ව කෘෂිකර්මාන්තය (Precision Agriculture)

ශ්‍රී ලංකා රජයේ හරිත කෘෂිකර්මාන්ත අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා උසස් තාක්ෂණයන් භාවිතය සඳහා සහයවීමට තේ වතු හා ගොවිපලවල්හි පාරිසරික දත්ත පිළිබඳව සළකා බලා තීරණ සඳහා සහය වන ක්‍රියාවලි සඳහා පහසුකම් සලකන IoT පදනම් විසඳුම් භාවිතා කරමින් ACCIMT ආයතනය විසින් “යථාතත්ව කෘෂිකර්මාන්තය (Precision Agriculture)” පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ජල සම්පාදන අවශ්‍යතාවන් හා ප්‍රශස්ත පොහොර භාවිතය තක්සේරු කිරීම හා ප්‍රාථමික පාංශු පෝෂක (නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම්) හොඳින් මැනීම යෝජිත යෙදවුමෙහි ප්‍රධාන ප්‍රතිලාභවේ. භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවය හා විශේෂ උපදෙස් මත පොහොර භාවිතයට පෙර හා පසුව මැනිම් සිදුකළ හැකිවේ.

5.2 ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති






Xilinx FPGA තාක්ෂණය පදනම්වූ තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය

පද්ධතිය නිර්මාණය කිරීම නිමකර ඇති අතර තේ කර්මාන්ත ශාලාවකින් ලබාගත් සීමිත තේ සාම්පල සමගින් වැඩබිම් පරිසරයකදී පරීක්ෂා කරන ලදී.

විවිධ ප්‍රමාණයන්ගෙන් හා වර්ණයන්ගෙන් යුත් තේ කොළ අදාල කර්මාන්තශාලා පරිසරයකදී පරීක්ෂා කිරීම මීලඟ පියවරවේ. එක් වරකදී, පුනරාවර්ත ක්‍රියාත්මක කිරීම් වලදී යන්ත්‍රය ක්‍රමාංකනය කිරීම, ඉගෙනීම, පුහුණුවීම, ක්‍රියාවලියේ වේගය සියුම්ව සකස් කිරීම කර්මාන්තශාලාවේදී ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂා කෙරේ. විනයෙන් හෝ කොරියාවෙන් ගෙන්වන ලද යම් පද්ධතියක් ස්ථාපනය කිරීමෙන් අනතුරුව පද්ධතිය කර්මාන්තශාලාවන්හි පරීක්ෂා කිරීම සිදු කෙරේ.

ත්‍රිමාන (3D) සිතියම්ගත කිරීම පදනම් පථයක ගමන් ගන්නා රෝවරයක් මගින් භූමිය සිතියම්ගත කිරීම

මෙය පර්යේෂණ ව්‍යාපෘතියක් වන බැවින් 3D SLAM ඇල්ගොරිදම සඳහා පහත සඳහන් අංගයන්හි තවදුරටත් වැඩිදියුණු කිරීම් හා වෙනස් කිරීම කරනු ලැබීය.

- ආවරණ ප්‍රදේශ (උදා - උමං) හා විවෘත ප්‍රදේශ (වීදි)
- සිතියම්ගත කිරීම හා ඇමිණීම (ආවරණ ප්‍රදේශ එකට එකතුකර ඇමිණීම)
- භාවිතයට පහසු VeloView අතුරුමුහුණත සඳහා මීට පෙර ක්ෂණිකව දත්ත ලබාදෙන (ROS - Real-time Operating System) පද්ධතිය එකතු කිරීම.

ගවේෂණ ඇල්ගොරිදම මූලික විඩම්බකය පරීක්ෂා කිරීම (ගැසබෝ විඩම්බකය මගින් RRT පාදක ප්‍රත්‍යන්ත ඇල්ගොරිදම පරීක්ෂා කිරීම)





පූර්ව දැනුම්දිය හැකි නඩත්තු ඒකකයක් (PdM) හරහා පද්ධති වැඩිදියුණු කිරීම සඳහා අඩුවියදම් විසඳුමක්

පූර්ව දැනුම්දිය හැකි නඩත්තු මධ්‍යස්ථානයක් ස්ථාපනය සඳහා ආධාර වන කාර්යයන් ලෙස මෙම ව්‍යාපෘතියේ I හා II වන අදියර සිදුකරනු ලැබීය.

I අදියරේදී දෝෂ විඩම්භකය නිර්මාණයකර නිපදවනු ලැබීය.

II වන අදියරේදී, දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ අදහසින් මෙම දෝෂ විඩම්භකය භාවිතාකර සැබෑ ලෙස ඇතිකරන ලද පාලනය කරන ලද පර්යේෂණ හරහා විවිධ කම්පන සටහන් අධ්‍යයනය කිරීම සිදුකරන ලදී. මෙම අදියරේදී විඩම්බකය ජියර් පද්ධතියක් සමග ඒකාබද්ධ කරනු ලැබීය. MAT ආධාරයෙන් සටහන් විශ්ලේෂණ ලබාගැනීම සඳහා අතුරුමුහුණතක් වැඩිදියුණු කරනු ලැබීය.





පොලිටනල සඳහා උෂ්ණත්වය අධීක්ෂණය/ පාලනය කිරීමේ පද්ධතිය

අහිතකර කාලගුණික තත්වයන්ට මුහුණදීම පිණිස කලාපයේ තිරසාර භෝග නිෂ්පාදනය සඳහා පහසුකම් සැළසීමට පොලි ටනල තුළ ස්ථාවර උෂ්ණත්ව පරාසයක් අධීක්ෂණය කිරීම හා පවත්වා ගැනීම සඳහා නවීන ශක්‍ය හා පිරිවැය ඵලදායි තාක්ෂණයක් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණවේ.

මෙහි නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ස්ථානය ලෙස නාරම්මල පිහිටි බිම්මල් ගොවිපලක් හඳුනාගෙන තිබේ. මේ වනවිට එම ස්ථානයේ උෂ්ණත්ව පාලන පද්ධතිය ස්ථාපනය කර ඇති අතර ක්ෂේත්‍ර පරීක්ෂාවන් සම්පූර්ණකර ඇත. මෙම පද්ධතිය එක් එක් ගොවින්ගේ අවශ්‍යතාවන්ට අනුව කළමනාකරණය කිරීමේ/ පාලනය කිරීමේ හැකියාව ඇත.



විදුලිසැර වලින් ආරක්ෂාවීම සඳහා මධ්‍යස්ථානය

පර්යේෂණ හා සංවර්ධන ප්‍රවර්ධනය කිරීම, දැනුම බෙදාහැරීම, උපදේශන සේවාවන් සිදුකිරීම හා ප්‍රතිපත්ති නිර්දේශ සකස් කිරීමේ අරමුණ ඇතිව විදුලිසැර වලින් ආරක්ෂාවීමේ අංග සම්පූර්ණ මධ්‍යස්ථානයක් සැලසුම්කර ඇත. විදුලිසැර වැදීම් වලින් සිදුවන හානි හා පාඩු අඩුකිරීම, ආරක්ෂාව ප්‍රමිතිකරණය, විෂයට අදාල පර්යේෂණ හා සංවර්ධන වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල වනු ඇත. සළකා බලන ලද වසරේදී, රටේ විවිධ ප්‍රදේශයන්හි පිහිටා ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා සර්ජ් ආරක්ෂක පද්ධති සැලසුම් කිරීම හා පරීක්ෂා කිරීමේ සේවාවන් සපයනු ලැබීය. 2021 ජාත්‍යන්තර විදුලිසැර වලින් ආරක්ෂාවීමේ දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකීය හා විදේශීය (එක්සත් රාජධානිය,ඉන්දීයාව, දකුණු අප්‍රිකාව හා බංගලාදේශය) විද්වතුන්ගේ සම්පත් දායකත්වය ඇතිව වෙබිනාර් වැඩසටහනක් පවත්වනු ලැබීය.







තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් ඉල්ලීම් මත රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා සඳහා පර්ශිලක විශේෂිත යෙදවුම්වලට අනුව තොරතුරු පද්ධති යෙදවුම් වැඩිදියුණු කර ඇත.

තොරතුරු තාක්ෂණ (IT) විසඳුම් වැඩිදියුණු කිරීම

කාලගුණය අධීක්ෂණය කිරීම සඳහා තවත් ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන තුනක් එක්කිරීම



එකතුකරන ලද සංවේදී දත්ත දැක්වීම, එහි ප්‍රස්ථාරමය ඉදිරිපත් කිරීම, පර්යේෂණ සඳහා දළ දත්ත විශ්ලේෂණය හා දත්ත බාගත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් වෙබ් පාදක අතුරු මුහුණතක් වැඩිදියුණු කරන ලදී. මෙම විශේෂ මෘදුකාංග පද්ධතිය වැඩිදුරට සකස් කිරීම සඳහා තෝරාගත් දත්ත කට්ටල ප්‍රදර්ශනය කිරීම, විශ්ලේෂණය කිරීම හා බාගත කිරීම සඳහා අවශ්‍ය සියළු ලක්ෂණ වලින් සමන්විතවේ.

සිංහරාජයේ මෝනිං සයිඩ්, නකල්ස් පිටවලපතන හා හෝර්ටන් තැන්න යන ස්ථාන දැනට පවතින පද්ධතිය සඳහා අළුතෙන් එක්කරන ලදී.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ලියාපදිංචි කිරීම හා බාහිර විභාග ප්‍රතිඵල

ඉහත සේවාලාභියා සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අංගයක් ලෙස සිසුන් ලියාපදිංචි කිරීමේ හා කලා සාමාන්‍ය උපාධිය සඳහා විභාග මොඩියුලයක් සම්පූර්ණකර ඇත. මේ වන විට විශ්වවිද්‍යාලය මෙම පද්ධතිය භාවිතා කරන අතර 2022 දෙසැම්බර් වන විට සියළු අංග ඇතුලත් MIS සම්පූර්ණ කිරීමට සැලසුම්කර ඇත.





ජංගම දුරකථන යෙදවුම් (Mobile Apps) වැඩිදියුණු කිරීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් 2021 වසරේදී ජංගම දුරකථන යෙදවුම් ගණනාවක් වැඩිදියුණු කරනු ලැබූ අතර නිල්වලා ගඟේ ජල පොම්පාගාරයේ තත්කාලීනව ජල මට්ටම ප්‍රදර්ශනය කිරීමේ යෙදවුම ඉන් එක් ප්‍රධාන ව්‍යාපෘතියක් වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රතිලාභියා වන අතර තත්කාලීන දත්ත මගින් තීරණ ගැනීම සඳහා මෙම යෙදවුම ආධාරවේ.



ගිවිසුම්ගත සේවාවන්

දත්ත ගබඩා හා වෙනත් තොරතුරු පද්ධති ගිවිසුම්ගත නඩත්තු කිරීම්

- ගිණුම් පද්ධතිය – මොරටුව විශ්වවිද්‍යාලය, නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- ගිණුම් පද්ධතිය – ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- වැටුප් පද්ධතිය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය, නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- ගිණුම් පද්ධතිය – බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.

ආයතනික මෘදුකාංග වැඩිදියුණු කිරීම්

ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා 2021 වසරේදී පහත සඳහන් මෘදුකාංග පද්ධතිවල වැඩිදුර සංවර්ධනය කිරීම් හා වෙනස්කම් සිදුකරන ලදි.

- ව්‍යාපෘති ලේඛනගත කිරීමේ පද්ධතිය
- වැටුප් පද්ධතිය
- නිවාඩු හා පැමිණීම සටහන් කිරීමේ පද්ධතිය
- ගිණුම් පද්ධතිය
- ඉන්වොයිස් පද්ධතිය

ACCIMT LAN, වෙබ් අඩවිය හා අදාල ජාල සේවාවන්

ආයතනය සඳහා LAN, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් සේවාවන් නඩත්තු කරන ලදී.

5.3 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති

ද්විත්ව තාරකා පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණය

චීන විද්‍යා ඇකඩමියේ යුනාන් නිරීක්ෂණාගාරයේ සහයෝගිතාවය ඇතිව ද්විත්ව තාරකා (CV) පද්ධති පිළිබඳ පර්යේෂණ අධ්‍යයන 2018 වසරේදී ආරම්භ කරන ලදී. මෙම කාලය තුළ ඇමරිකානු තාරකා විද්‍යා සංගමයේ සහරාව ඇතුළු ජාත්‍යන්තර සහරා තුනක් හා එක් දේශීය ප්‍රකාශනයක් පළකරනු ලැබීය. මෙම දිගු කාලීන පර්යේෂණයේ අරමුණ white dwarf, accretion disk, Roche-Lobe, hotspot ආදී CV පද්ධතිවල එක් එක් සංරචකයන්ට අදාල ස්කන්ධය වෙනස්වීම, පිපිරුම්, කෝණිය වලන නැතිවීම, චුම්බක ගතිලක්ෂණ, කක්ෂීය වලනය ආදී යාන්ත්‍රණ මගින් නෝවා, නෝවා-වැනි පද්ධති, නිලීන නෝවා, රිකරන්ට් නෝවා, සුපර්නෝවා, චුම්බක හා මධ්‍යම චුම්බක CVs හා ඒවායේ උප පද්ධති ආදී ද්විත්ව තාරකා පද්ධති හා ඒවායේ ක්‍රමයෙන් වෙනස් වන ලක්ෂණ අධ්‍යයන කිරීම හා පරීක්ෂා කිරීමවේ.

ප්‍රතිඵල

ස්විට්සර්ලන්තයේ බහුවිෂයානුබද්ධ ඩිජිටල් ප්‍රකාශන ආයතනයක (MDPI) “GALAXY” නම් ජාත්‍යනතර සහරාවක පර්යේෂණ පත්‍රිකාව පළකරනු ලැබීය.

පර්යේෂණ පත්‍රිකාවේ මාතෘකාව: A Brown Dwarf Companion to the Nova-like Variable RW Tri



galaxies

MDPI

Article

A Brown Dwarf Companion to the Nova-like Variable RW Tri

Zhibin Dai [1,2,3,*], Shengbang Qian [1,2,3] and Indika Medagangoda [4]

1 Yunnan Observatories, Chinese Academy of Sciences, Kunming 650216, China; qsb@ynao.ac.cn
2 Center for Astronomical Mega-Science, Chinese Academy of Sciences, Beijing 100012, China
3 University of Chinese Academy of Sciences, Beijing 100049, China
4 Arthur C. Clarke Institute for Modern Technologies, Moratuwa 10400, Sri Lanka; indika@accmt.ac.lk
* Correspondence: zhibin_dai@ynao.ac.cn; Tel.: +86-871-67339079

ඩෙල්ටා ස්කූටි තාරකාවල වර්ණාවලීක්ෂ අන්වේක්ෂණය (Asteroseismology)

ඩෙල්ටා ස්කූටි තාරකා යනු HR රූපසටහන්හි ප්‍රධාන තීරයේ හා ප්‍රධාන තීරයට අනුයාතව පිහිටා ඇති කෙටි කාලීන ආලෝක විචල්‍ය කාරකාවේ. ඩෙල්ටා ස්කූටි තාරකාවල අභ්‍යන්තර ලක්ෂණ තවමත් නොදන්නා කරුණකි. අරීය හා අරීය නොවන ආකාර රැස් විහිදීම් හඳුනා ගැනීම මගින් ඩෙල්ටා ස්කූටි තාරකාවල අභ්‍යන්තර ව්‍යුහ ලක්ෂණ දැක්වේ. පෘථිවිය සිට ලබාගන්නා වර්ණාවලීක්ෂ නිරීක්ෂණ මගින් මෙම අන්වේක්ෂණ සඳහා ආධාරවේ.
ස්පාඤ්ඤයේ HERMES Mercator දුරදක්නය භාවිතයෙන් ඉහල විභේදනයක් සහිත හා ඉන්දියාවේ මවුන්ට් අබු නිරීක්ෂණාගාරයේ අඩු විභේදනයක් සහිත SZ Lyn ඩෙල්ටා ස්කූටි කාරකාව නිරීක්ෂණය කරනු ලැබීය. ඉහල විභේදනයක් සහිත ඡායාරූප හා ඉන්දියාවේ මවුන්ට් අබු නිරීක්ෂණාගාරයේ අඩු විභේදනයක් සහිත වර්ණාවලීක්ෂ දත්ත මුලින්ම තාරකාමය පරාමිතීන්හි නියමිත මොඩල සෑදීම සඳහා කෘතිම වර්ණාවලි සමග විශ්ලේෂණය කරනු ලැබීය.



e-CALLISTO ජාලය සඳහා දිගු තරංග ආයාම ඇන්ටනා පද්ධතියක් නිර්මාණය කිරීම හා ඉදිකිරීම

සූර්යයා මත ඇතිවන ශක්තිය විහිදුවන සූර්ය ගිනිදැල් සූර්ය නක්ෂත්‍රයේ තවමත් නොදන්නා භෞතික ක්‍රියාවලියකි. සූර්ය ගිනිදැල් පිටවීමේ ක්‍රියාවලිය සඳහා සුදුසු මොඩලයක් සකස් කිරීම සඳහා දිගු කාලීන පදනමින් සූර්ය ගිනිදැල්වල බහු තරංග ආයාම අධ්‍යයනයක් සිදුකළ යුතුය. ගිනිදැල් පිටවීමේ මොඩලය සකස් කිරීම සඳහා සූර්ය ගිනිදැල් වල චුම්බක ක්ෂේත්‍ර මිනුම් අත්‍යාවශ්‍ය වේ. එමනිසා ධ්‍රැවීකරණ මැනීම සඳහා සැකැස්මක් අවශ්‍ය කෙරේ.

සූර්ය ගිනිදැල් ධ්‍රැවීකරණ මිනුම් සඳහා CALLISTO ග්‍රාහක දෙකක් සඳහා ඇන්ටනාව හා ගුවන්විදුලි සංඛ්‍යාත ඉලෙක්ට්‍රොනික (RF) සැලසුම් කිරීම හා ඉදිකිරීම කළ යුතුවේ.
ඇන්ටනා පද්ධතිය නිර්මාණය කිරීමේ අදියර 2021 වසරේදී නිමකරන ලදී. මෙම යෝජිත ඇන්ටනාව සංඛ්‍යාත පරාසය 10-100 MHz තුල ක්‍රියාත්මකවේ. එකී සංඛ්‍යාත පරාසය තුල ඇන්ටනාවේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා 4NEC2 ඇන්ටනා නිර්මාණය කිරීමේ මෘදුකාංගය භාවිතා කෙරේ. ඇන්ටනාව නිර්මාණය කිරීම හා ක්‍රියාකිරීමේ ප්‍රථිපල පහත රූපයේ දැක්වේ.



Fig. 4. Total gain for each frequency in the considered frequency range (with 1 MHz resolution). Maximum gain 9.12 can be seen at 54 MHz. At 100 MHz, the gain is 7.11 and near 20 MHz it is 7.61.



5.4 දුරස්ථ සංවේදනය (RS) හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති

විවෘතව ප්‍රවේශවිය හැකි චන්ද්‍රිකා දත්ත (Open Access Satellite data) භාවිතයෙන් ශ්‍රී ලංකාවේ වන ආවරණ ආකාර සිතියම්ගත කිරීම.

වන ආවරණය පරිසර පද්ධතියේ වැදගත් කොටසක්වේ. ශ්‍රී ලංකාවේ වනාන්තර ඒවාට ආවේණික ලක්ෂණ වලට අනුව (ඝන වනාන්තර, විවෘත හා විරල වනාන්තර, වනලැහැබ්, කඩොලාන, වන වගාවන් (මිනිසා විසින් වවන ලද වනාන්තර) ආදීය) විවිධ වර්ගයන්ට කාණ්ඩ කෙරේ. වඩා හොඳ කළමනාකරණ හා සංරක්ෂණ කාර්යයන් සඳහා එක් එක් කාණ්ඩය නිවරදීව සිතියම්ගත කිරීම සැබෑ අවශ්‍යතාවකි. සම්ප්‍රදායික (ක්ෂේත්‍ර සමීක්ෂණ) ක්‍රම සඳහා කාලයක් ගතවේ. දැන් උසස් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත මගින් ස්ථානීය මිනුම් මගින් මෙන්ම ඒ හා සමාන අවිනිශ්චිත මට්ටමෙන් ආසන්න වශයෙන් වන ආවරණ ආකාරය සිතියම්ගත කිරීමට හැකිවේ. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ වන ආවරණ ආකාරය අධීක්ෂණය කිරීම සඳහා විවෘත ප්‍රවේශ දුරස්ථ සංවේදී ප්‍රකාශ දත්ත හා SAR (කෘතිම විවර රේඩාර්) දත්ත භාවිතා කිරීමේ විභාවතාව පරීක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනයේදී sentinel-2 ඡායාරූප භාවිතයෙන් කඩොලාන සිතියම්ගත කිරීමේ ක්‍රමය වැඩිදියුණු කරන ලදී. වෙනත් වන ආවරණ භූමි කඩොලාන භූමි වලින් වෙන්කිරීම සඳහා අභඹු වනාන්තර ඇල්ගොරිදමය සමග ඒකාබද්ධ කඩොලාන හඳුනා ගැනීමේ දර්ශක (CMRI), යථාතත්වයට පත්කරන ලද වෙනස් ජල දර්ශකය (NDWI) හා කඩොලාන වන දර්ශකය (MFI) ඒකාබද්ධ කෙරේ.



GIS හා සිතියම් විද්‍යාව භාවිතයෙන් කොවිඩ්-19 වසංගත විද්‍යාව හා ඇගයීමේ ක්‍රමය

කොවිඩ්-19 වසංගතය ලොව පුරා ඉතා ශීඝ්‍රයෙන් පැතිරි ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව කුඩා කණ්ඩායම් වශයෙන් ඒකරාශීවීම් හා ජනයා පිරුණු ස්ථානයන්හි වයිරසය සීඝ්‍රයෙන්ම පැතිරෙන ස්ථාන වේ. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන්ම අවදානම් කලාප පිළිබඳ තොරතුරු ලබාගැනීමට අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් හා දුරස්ථ සංවේදන දත්ත භාවිතා කළ හැක. මෙම අධ්‍යයනයේදී දුරස්ථ සංවේදන දත්ත හා දුරස්ථ නොවන සංවේදන දත්ත යන දත්ත වර්ග දෙක භාවිතා කර ඇත. දුරස්ථ සංවේදන දත්ත ලෙස Landsat 8 Mosaic භාවිතා කරන ලද අතර රෝහල් සිතියම්, ජාතික මාර්ග ජාලය, ගොඩනැගිලි සිතියම දුරස්ථ නොවන සංවේදී දත්ත වේ. කොවිඩ්-19 අවදානම තීරණය කිරීමේ ක්‍රමය (1) උවදුර (2) අනතුරු අවදානම (3) ධාරිතාවය යන පරාමිතීන් යොදාගන්නා ආපදා අවදානම ඇගයීමක් මත පදනම් සිදුකළ යුතුය.



මෙම අධ්‍යයනයේදී, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ මහජනයාට ලබාගත හැකි කොවිඩ්-19 දත්ත භාවිතා කර ඇත. දත්තවල වැරදි හේතුවෙන් මොඩලය ප්‍රතිඵල ලබා නොදුන් අතර විශ්ලේෂණය සඳහා නැවත දත්ත ඉල්ලා ඇත.

5.5 පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාවේ පෘථිවි නිරීක්ෂණ දත්ත භාවිතාකරණ ආයතනයන්ට අවශ්‍ය දත්ත ලබාගැනීමට අවශ්‍ය භෞමික මධ්‍යස්ථානයක් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. යෝජිත මධ්‍යස්ථානය භෞමික මධ්‍යස්ථාන 3ක් දක්වා පුළුල් කිරීමට අපේක්ෂිතය.

ආයතනය අරමුදල් සපයා ගැනීමේ අපහසුතා පිළිබඳව සළකමින් හා පෘථිවි නිරීක්ෂණ භෞමික චන්ද්‍රිකා මධ්‍යස්ථාන මෙහෙයුම්කරන ජාත්‍යන්තර ප්‍රජාව විසින් අනුගමනය කරන සාමාන්‍ය ක්‍රමය අනුව යමින් යෝජිත ජාතික මධ්‍යස්ථානයේ පළමු භෞමික මධ්‍යස්ථානය සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස වැඩිදියුණු කිරීමේ අවස්ථා සොයා බලනු ලැබූ අතර මීට පෙර Institute of Remote Sensing and Digital Earth ලෙස හඳුන්වන ලද චීනයේ ප්‍රධාන සිවිලියන් චන්ද්‍රිකා මෙහෙයුම්කරන ආයතනය වන චීන විද්‍යා ඇකඩමිය (CAS) යටතේ ඇති AIR-CAS, Aerospace Information Research Institute (AIR) සහයෝගිතා හවුල්කරු ලෙස සාර්ථක ලෙස සම්බන්ධකර ගැනීමට හැකිවිය.

මෙම අපේක්ෂිත සහයෝගිතාවය අනුව AIR-CAS විසින් භෞමික මධ්‍යස්ථානය සඳහා උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම හා මෙහෙයුම් කිරීම මෙන්ම AIR-CAS වියදමින් නම්කරන ACCIMT ඉංජිනේරුවන් පුහුණු කිරීම හා භෞමික මධ්‍යස්ථානය ක්‍රියාත්මකවූ විට ACCIMT ට චන්ද්‍රිකා ඡායාරූප ලබාදීමට හා භෞමික මධ්‍යස්ථානයේ ඇති උපකරණ භාවිතාකර කැමති වෙනත් චන්ද්‍රිකාවකට ප්‍රවේශවීම සහ ACCIMT පාර්ශවයෙන් මෙම පහසුකම ස්ථාපනය කිරීමට අවශ්‍ය ඉඩම, ගොඩනැගිල්ල හා වෙනත් යටිතල පහසුකම් හා එහි තාක්ෂණික මෙහෙයුම් සිදුකිරීමට අන්‍යෝන්‍යය වශයෙන් එකඟවී ඇත.

GF-1 මාලාවේ චන්ද්‍රිකා 3 මගින් ග්‍රහණය කරගත් ශ්‍රී ලංකාවට ඉහලින් ඇති (හා එහි අනන්‍ය ආර්ථික කලාපයේ) චන්ද්‍රිකා දත්ත ලබාදීමට AIR-CAS විසින් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර ශ්‍රී ලංකාවේ චන්ද්‍රිකා දත්ත භාවිතාකරන ආයතනයන්හි අවශ්‍යතාවන් වඩාත් හොඳින් ඉටුකරදීමේ අදහසින් චීනය විසින් ක්‍රියාත්මක ඉහල විභේදනයක් සහිත ඡායාරූප ලබාදෙන වෙනත් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකාවක් මගින් ද දත්ත ලබාගැනීම ACCIMT අපේක්ෂාවවේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන අතරම දැනට යෝජිත වැඩපිළිවෙල යටතේ RADI විසින් ලබාදීමට අපේක්ෂිත GF-1 දත්ත හැර එකී චීන චන්ද්‍රිකාවේ අමතර දත්ත සඳහා ප්‍රවේශය ලබාගැනීම සඳහා චීන රජයේ අදාල බලධාරීන් සමග සාකච්ඡා ආරම්භ කිරීමට ද අනුමැතිය අපේක්ෂා කරනු ලැබීය. GF-2 හා GF-3 චන්ද්‍රිකා මාලාවන් මගින් මෙකී අමතර චන්ද්‍රිකා දත්ත ලබාගැනීමට ACCIMT බලාපොරොත්තු වේ.

5.6 පර්යේෂණ ප්‍රකාශන හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම

1. A Brown Dwarf Companion to the Nova-like Variable RW Tri, Galaxies 2021, 9, 94. https://doi.org/10.3390/galaxies9040094

5.7 පරීක්ෂා කිරීම් හා මිනුම්, දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශන සේවා

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිනුම් විද්‍යාගාරයේ පරීක්ෂා කිරීම් හා මැනුම් සේවාවන් - ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය



වසර තුල මෙම අංශය මගින් ප්‍රධාන වශයෙන්ම බැටරි, සර්ජ් ආරක්ෂක උපකරණ (SPDs), විදුලි පේනු, සොකට්, ස්විච, RC පරිපථ භේදක (RCCB), ක්ෂුද්‍රරූපී පරිපථ භේදක (MCB) හා අපවර්තක සඳහා කාර්යසාධන පරීක්ෂණ වාර්තා 144ක් නිකුත් කරන ලදී. පාරිභෝගික පිහිටීම් වලදී සිදුකරන ලද විදුලිබල තත්ව මිනුම් වලට අමතරව අංශය මගින් විද්‍යුත්/ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වල ආරක්ෂාව පරීක්ෂා කිරීම හා විදුලිබල තත්ව මිනුම් සිදුකරනු ලැබීය. ඩග්ලස් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සී.ඊ.එල්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ඒසීඑල් ඉලෙක්ට්‍රික් (ප්‍රයිවට්) ලිමිටඩ් ප්‍රධාන සේවාලාභීන් වේ.

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් සිදුකළ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ/ අළුත්වැඩියා කිරීමේ සේවාවන් හා උපදේශන කාර්යයන්

සමාලෝචනයට ලක්වන කාලය තුළ ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් උපදේශන හා දෘඩකාංග පිළිසකර කිරීමේ කාර්යයන් 51ක් සිදුකරන ලදී.

සිදුකරන ලද ප්‍රධාන දෘඩකාංග පිළිසකර කිරීම හා උපදේශන සේවාවන්ට;

- NERD මධ්‍යස්ථානය සඳහා බැටරි පරීක්ෂා කිරීමේ උපකරණය පිළිසකර කිරීම.
- SD&CC සඳහා PLC ඒකක පිළිසකර කිරීම.
- ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම සඳහා අලි වැටෙහි එනජයිසරයේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, ඇතුලත්වේ





සන්නිවේදන අංශය විසින් සිදුකරන ලද පරීක්ෂා කිරීම් හා මැනුම් සහ උපදේශන සේවා

කර්මාන්ත සඳහා උපදේශන සැපයීම, කොක්සියල් කේබල්, නෙට්වර්ක් කේබල්, ඇන්ටනා හා RF උපකරණ සඳහා පිරිවිතර/ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම හා ගුවන්විදුලි සංඛ්‍යාත යෙදවුම් පරීක්ෂා කිරීම හා මිනුම් සේවාවන් සැපයීම මේ යටතේ සිදුකරනු ලැබූ කාර්යයන් වේ.

පහත සමාගම් සඳහා උපදේශන සේවා සපයන ලදී.

- බ්‍රැන්ඩික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- වී-එෆ්එම් ගුවන් විදුලි සේවය

පරීක්ෂා කිරීම් හා මැනීම්

ප්‍රධාන වශයෙන්ම විශේෂ අවශ්‍යතාවන් මත පොලිස් සන්නිවේදන ඒකකය සඳහා ගුවන්විදුලි සංඛ්‍යාත මැනුම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

ක්‍රමාංකන විද්‍යාගාරය මගින් පිරිනමන ලද උපකරණ ක්‍රමාංකන / ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේ සේවාවන් - කාර්මික සේවා අංශය





වසර තුළ ප්‍රධාන වශයෙන්ම ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් පරීක්ෂා කිරීම් උපකරණ සඳහා ක්‍රමාංකන සේවාවන් සපයනු ලැබූ අතර ක්‍රමාංකන වාර්තා අසූ තුනක් නිකුත් කරනු ලැබීය. ඩිජිටල්/ ඇනලොග් මල්ටි මීටර්, දෝලනේක්ෂ, ස්කෝප් මීටර්, AC/DC ක්ලැම්ප් මීටර්, ඉහල වෝල්ටීයතා ටෙස්ටර, හිපෝට් ටෙස්ටර, ප්‍රොසෙස් මීටර්, විදුලිබල හා සංඛ්‍යාත විශ්ලේෂක, වොට් මීටර, එහා මෙහා ගෙනයා හැකි යන්ත්‍ර පරීක්ෂා කිරීමේ උපකරණ, තාප පරිවරණ අඛණ්ඩතාව පරීක්ෂා කිරීමේ උපකරණ, භූගත කිරීම් පරීක්ෂා කිරීමේ උපකරණ, RCCB පරීක්ෂා කිරීමේ උපකරණ, සහ බහුකාර්ය පරීක්ෂා කිරීමේ උපකරණ ක්‍රමාංකනය කරන ලද උපකරණ වලට අයත්වේ.

LTL ට්‍රාන්ස්ෆෝමර්ස්, කොහොකු ලංකා, MAS ෆැබ්රික් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලංකා ඛණිජ තෙල් සංස්ථාව, එලිවේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ප්‍රොෆෙෂනල් මෙට් කන්සල්ටන්සි, වෙනෝරා ඉන්ටර්නැෂනල්, ඩෙව්ඩ් පීරිස් මෝටර් සමාගම, බැල්ෆෝ බීට්, පුබුදු ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිවඩ්සන් ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉලෙක්ට්‍රෝ මෙටල් ප්‍රොසෙසින් (ප්‍රයිවට්) ලිමිටඩ්, හේලීස් හා පෙන්ටන්ස් ලිමිටඩ් අපගේ ප්‍රධාන සේවාලාභින්වේ.

ආලෝක මිනුම් සේවා (LMS) විද්‍යාගාරය මගින් පිරිනමන ලද ආලෝක මිනුම් සේවාවන් - කාර්මික සේවා අංශය





LED හා CFL විදුලි පහන් පරීක්ෂා කිරීම සඳහා ආලෝක මිනුම් සේවාවන් සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගීතාවය ඇතිව පරීක්ෂණ වාර්තා අනූ දෙකක් නිකුත් කරන ලදී. ඔරෙල් කෝපරේෂන්, කැලනි කේබල්ස් පීඑල්සී, සොෆ්ට් ලොජික් රිටේල් (ප්‍රයිවට්) ලිමිටඩ්, චිනට් එනර්ජී (ප්‍රයිවට්) ලිමිටඩ් හා ග්ලෝබල් ට්‍රේඩින් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ් අපගේ ප්‍රධාන සේවාලාභින්වේ.

6.1 වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

CCTV ආරක්ෂක පද්ධති (ELV) වින්‍යාසය සකස් කිරීම, ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම

විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් යොමුකළ 25 දෙනෙකු (විදාතා නිලධාරීන්) සඳහා එක් CPD වැඩසටහනක් (පැය 30/ සති අග) පවත්වන ලදී. සහභාගී වූවන් සඳහා දැනට වෙළඳපලෙහි ඇති උපාංග භාවිතාකර තමාගේම CCTV පද්ධති නිර්මාණය කිරීමේ දැනුම ලබාදෙනු ලැබීය. ඔවුන්ට න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික දැනුම, එක් එක් සංරචකය පිළිබඳ ප්‍රායෝගිකව අත්හදා බැලීමේ අවස්ථාව සළසා දී තමාගේම වාණිජ ව්‍යාපෘතියක් කර ගෙනයාම පිළිබඳව මෙහිදී මූලික වශයෙන් අවධානය යොමුකරනු ලැබීය.

වැඩසටහන් ගතකළ හැකි ලොජික් පාලන පද්ධති

ගොඩනැගිලි	182,714,758.01			182,714,758.01
වන්දිකා ඇන්ටනා	2,959,797.83			2,959,797.83
පරිගණක	77,552,461.26	695,600.00		78,248,061.26
විද්‍යාගාර උපකරණ	256,102,900.19	147,827.66		256,250,727.85
කාර්යාල උපකරණ	40,803,788.58	161,362.00		40,965,150.58
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	20,073,460.86	141,651.50	(59,725.65)	20,155,386.71
මෝටර් රථ	28,785,689.00			28,785,689.00
පුස්තකාල පොත්	24,427,283.97	146,682.00		24,573,965.97
	633,420,139.70	1,293,123.16	(59,725.65)	634,653,537.21
සමුච්චිත ක්ෂය කිරීම				
සින්නක්කර වත්කම්				
ගොඩනැගිලි	69,707,846.57	9,135,737.90		78,843,584.47
වන්දිකා ඇන්ටනා	2,959,778.83	-		2,959,778.83
පරිගණක	58,025,211.80	5,281,657.64		63,306,869.44
විද්‍යාගාර උපකරණ	162,654,018.24	16,127,731.48		178,781,749.72
කාර්යාල උපකරණ	23,772,726.70	2,675,070.78		26,447,797.48
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	12,430,890.29	1,496,717.07	46,440.53	13,974,047.89
මෝටර් රථ	28,479,789.47	65,440.00		28,545,229.47
පුස්තකාල පොත්	24,021,184.39	114,097.92		24,135,282.31
	382,051,446.29	34,896,452.79	46,440.53	416,994,339.61
ඉදිරියට ගෙන ආ අගය	251,368,693.41			217,659,197.60

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 23 වන පිටුවට ගෙනයන ලදී.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2021 දෙසැම්බර් 31 දිනට (ඉදිරියට)

		2021 රු.	2020 රු
(17) සිදු කෙරෙමින් පවතින වැඩ - ඉදිකිරීම්			
WIP - ගෘහභාණ්ඩ හා සවිකිරීම් (කැම කාමරය)		-	110,264.00
WIP ගොඩනැගිල්ල - මායිම් ලකුණු කිරීම හා ආරක්ෂාව (පිටිපන)		3,545,744.40	3,545,744.40
		3,545,744.40	3,656,008.40
(18) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ			
ගෙවිය යුතු ගිණුම් -TG	(උපලේඛණය 08)	284,717.10	285,223.58
ගෙවිය යුතු ගිණුම් -PC	(උපලේඛණය 08)	71,190.00	79,530.70
වැටුප් හා වේතන පාලනය		-	174,525.00
E.P.F. පාලන		1,725,956.65	1,563,882.02
E.T.F.පාලන		207,114.80	187,665.84
සුභසාධක සමිති පාලන		-	-
ණය හිමි - මහ භාණ්ඩාගාරය		1,391,884.00	900,764.56
ආපසු ගෙවන තැන්පතු		87,600.00	-
ලැබීම් මත ගෙවිය යුතු VAT P - P/C		38,219.71	38,219.71
සුභසාධක සමිති පාලන		200.00	-
ගෙවිය යුතු NBT - TG			
ගෙවිය යුතු NBT - P/C		6,080.00	6,080.00
ගෙවිය යුතු මුද්දර ගාස්තු - TG		9,425.00	9,200.00
ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බදු (Payee tax) - TG		11,943.00	1,366.00
උපයෝජන පාලනය		3,088,216.57	2,501,217.45
ගොඩනැගිලි දෙපාර්තමේන්තු ණයහිමි		984,403.00	984,403.00
ආපිකෝ ඉන්ටීරියර්ස් -ණයහිමි		14,377.61	14,377.61
TG පාලන		(3,450,474.49)	(5,120,536.07)
රඳවාගැනීම්		1,339,624.66	1,817,186.03
ණයහිමි - ටී එන් වික්‍රමසිංහ		-	7,894.45
ණයහිමි- ඩබ් ඩී වාමික		8,535.13	8,535.13
ණයහිමි - ටී දයාරත්න		-	8,323.89
ණයහිමි - එච් විජේසූරිය		25,827.02	22,627.66
ණයහිමි - පී මහදේවන්		-	7,283.49
ණයහිමි - එන් ඒ ඒ එන් දිල්රුක්ෂි		-	4,377.00
වෘත්තීය සමිති පාලනය		100.00	
		5,844,939.76	3,502,147.05
(19) සමුච්චිත වියදම්			
භාණ්ඩාගාර අරමුදල්	(උපලේඛණය 09)	3,504,062.40	5,961,025.82
ව්‍යාපෘති / පාඨමාලා	(උපලේඛණය 09)	264,778.00	1,566,800.00
		3,768,840.40	7,527,825.82

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 24 වන පිටුවට ගෙනයන ලදී.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2021 දෙසැම්බර් 31 දිනට (ඉදිරියට)

		2021 රු.	2020 රු.
(20) විශ්‍රාම ප්‍රතිලාභ වගකීම			
වසර ආරම්භයේ ඇති ශේෂය		49,678,539.54	43,072,003.78
එකතුකළා :			
වසර සඳහා ප්‍රතිපාදන		4,150,710.51	7,079,173.26
		53,829,250.05	50,151,177.04
අඩුකලා :			
වසරතුළ සිදුකළ ගෙවීම්		(994,160.00)	(472,637.50)
වසර අවසානයේ ශේෂය	(උපලේඛණය 10)	52,835,090.05	49,678,539.54
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා උපකල්පන			
වට්ටම් අනුපාතය		6.50%	6.50%
වැටුප් වර්ධක		8.00%	8.00%
කාර්ය මණ්ඩල පිරිවැටුම්		7.03%	8.93%
විශ්‍රාම යන වයස		වසර 62	වසර 60
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
(21) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන			
ආරම්භයේ ඇති ශේෂය		353,668,028.23	373,942,879.87
කාලසීමාව තුළ ලැබූ ප්‍රදානයන්		11,740,000.00	29,117,000.00
ගැලපීම්		-	-
ධාරිතා වර්ධන වැඩසටහන්		(22,051,563.95)	(11,869,688.22)
ක්‍රමක්ෂය		(34,460,629.43)	(37,522,163.42)
වසර අවසානයේ ශේෂය		308,895,834.85	353,668,028.23
මුදල් නොවන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන			
වසර ආරම්භයේ ඇති ශේෂය		133,052.05	1,411,052.05
කාලසීමාව තුළ ලැබූ ප්‍රදානයන්			
ක්‍රමක්ෂය		(133,052.05)	(1,278,000.00)
වසර අවසානයේ ශේෂය		-	133,052.05
අමාත්‍යාංශයේ ප්‍රාග්ධන ප්‍රදාන		13,156,751.40	13,156,751.40
		13,156,751.40	13,156,751.40
ප්‍රාග්ධන ප්‍රදාන		322,052,586.25	366,957,831.68

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 25 වන පිටුවට ගෙනයන ලදී.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2021 දෙසැම්බර් 31 දිනට (ඉදිරියට)

	2021 රු.	2020 රු.
(22) සංචිත		
පොදු සංචිතය	272,721.64	272,721.64
සෙල්ටෙල් පරිත්‍යාග	213,333.34	213,333.34
පර්යේෂණ හා උපදේශන අරමුදල	1,341,446.90	1,341,446.90
විදේශ ප්‍රදාන	3,464,295.25	3,464,295.25
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,682,504.54	26,682,504.54
	31,974,301.67	31,974,301.67
පර්යේෂණ සංචිතය		
ආරම්භයේ ඇති ශේෂය	205,583.83	175,988.09
ලැබීම්	-	29,683.00
ගැලපීම්	(4,322.54)	(87.26)
වියදම්		
	201,261.29	205,583.83
	32,175,562.96	32,179,885.50
වෙනත් ප්‍රදාන හා පරිත්‍යාග		
ආරම්භයේ ඇති ශේෂය	23,066,377.26	23,375,926.37
ලැබූ ස්ථාවර වත්කම්	-	-
ගැලපීම්		
ක්‍රමක්ෂය	(302,771.31)	(309,549.11)
	22,763,605.95	23,066,377.26
ප්‍රත්‍යාගණන අරමුදල		
ආරම්භයේ ඇති ශේෂය	14,657,416.69	13,714,316.46
ලැබීම්	429,251.12	149,922.65
ගැලපීම්	-	(48,112.15)
පොලී ආදායම	607,436.17	841,289.73
වියදම්		
	15,694,103.98	14,657,416.69
අධ්‍යක්ෂවරයාගේ අරමුදල		
ආරම්භයේ ඇති ශේෂය	1,611,253.26	1,507,989.80
පොලී ආදායම	88,183.12	165,802.63
ගැලපීම්	-	(62,539.17)
වියදම්		
	1,699,436.38	1,611,253.26

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 26 වන පිටුවට ගෙනයන ලදී.

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2021 දෙසැම්බර් 31 දිනට (ඉදිරියට)

	2021 රු.	2020 රු.
FINDS ප්‍රදාන		
ආරම්භයේ ඇති ශේෂය	8,255,183.14	7,675,740.06
පොලී ආදායම	426,167.76	579,443.08
වියදම්		-
	8,681,350.90	8,255,183.14
NASDA ප්‍රදාන		
ආරම්භයේ ඇති ශේෂය	7,217.24	7,251.87
ගැලපීම්		
පොලී ආදායම	215.28	265.37
වියදම්	(300.00)	(300.00)
	7,132.52	7,217.24
	81,021,192.69	79,777,333.09
(23)සමුච්චිත අතිරික්තය/ (ගිහය)		
ආරම්භක ශේෂය -TG	(175,995,778.33)	(173,099,902.52)
ආරම්භක ශේෂය - P/C	51,749,362.54	46,501,908.50
ගැලපීම් - TG	509,729.28	876,014.18
ගැලපීම් - PC	265,219.03	(1,034,179.25)
වියදම් මත අමතර ආදායම	5,349,486.76	2,509,743.31
	(118,121,980.72)	(124,246,415.78)
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය	284,951,798.22	322,488,748.99

* ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව ක්‍රමක්ෂයකර ඇත.

" රජයේ ප්‍රදාන ගිණුම්කරණය හා රජයේ සහය අනාවරණය කිරීම "

9. සැලසුම්කරන ලද කෙටි හා මධ්‍යකාලීන ක්‍රියාකාරකම්වල සාරාංශය

- මූලික අභ්‍යවකාශ තාක්ෂණයන්හි ජාතික හැකියාවන් ලබාගැනීම හා වැඩිදියුණු කිරීම -

  - **ජාත්‍යන්තර සහයෝගීතා Kitsune නැනෝ චන්ද්‍රිකා ව්‍යාපෘතිය**
    ACCIMT ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනය (Kyutech) විසින් 6U නැනෝ චන්ද්‍රිකාවක් නිර්මාණය හා වැඩිදියුණු කිරීම සඳහා වන පස්-පාර්ශවීය සහයෝගිතා ව්‍යාපෘතියේ හවුල්කරුවෙක් ලෙස අඛණ්ඩව කටයුතු කරනු ලැබීය. Kitsune නැනෝ චන්ද්‍රිකාව නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම 2021 අවසානයේදී නිමකරන ලද අතර ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය මගින් 2022දී දියත් කිරීමට හා කක්ෂගත කිරීමට සැලසුම්කර ඇත.

  - විශේෂයෙන්ම නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍රයේ අභ්‍යවකාශ තාක්ෂණ ජාතික හැකියාවන් ලබාගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණ හැකියාවන් සහිත රටවල් සමග තවදුරටත් සහයෝගිතාවන් පවත්වාගෙන යාම.

  - දැනට වැඩිදියුණු කරමින් පවතින ඝනක චන්ද්‍රිකාවේ ඉංජිනේරු මොඩලය පියාසර මොඩලයක් දක්වා වැඩිදියුණු කරනු ලබන අතර එය ISS කක්ෂයේ දියත් කරනු ඇත. මෙහි ප්‍රධාන වශයෙන්ම සන්නිවේදන උපකරණ ඇතුලත් වේ.

- ශ්‍රී ලංකාවේ ගගන විද්‍යා නිර්මාණ හා නිෂ්පාදන හැකියාවන් වැඩිදියුණු කිරීම –
  ස්ථායීතාවය, පාලනය කිරීමේ හැකියාව හා විවිධ යෙදවුම් සඳහා සුදුසු ව්‍යුහයන් සහිතව වැඩිදියුණු කරන ලද නියත තටු ගණනක් ඇති UAVs (Unmanned Aerial Vehicles) හා භ්‍රමණ තටු හතරකින්/ භ්‍රමණතල හයකින් යුත් කොප්ටර් තාක්ෂණය සැලසුම් කිරීම හා වැඩිදියුණු කිරීම.

කෘෂිකාර්මික යෙදවුම් වලදී වන්ද්‍රිකා ඡායාරූප මගින් සිතියම්ගත කිරීම සඳහා අවශ්‍ය බහුවර්ණාවලීක්ෂ උපකරණ අන්තර්ගතකර සිරස්ව ගුවන්ගත කිරීමේ හා ගොඩබෑමේ හැකියාව ඇති (VTOL) UAV හා මල්ටිකොප්ටරයක් සහ ද්‍රව්‍ය විදින UAV සැලසුම් කිරීම හා වැඩිදියුණු කිරීම 2022-2023 සඳහා සැලසුම්කර ඇත.

- ශ්‍රී ලංකාවේ මැකාට්‍රොනික් හා රොබොටික් හැකියාවන් වැඩිදියුණු කිරීම - කර්මාන්ත සඳහා සුදුසු පාරිභෝගික අවශ්‍යතාවන්ට ගැලපෙන මැකාට්‍රොනික් හා රොබොටික් යෙදවුම් වැඩිදියුණු කිරීම.

- **දුරස්ථ සංවේදන හා භූගෝලීය තොරතුරු පද්ධති (RS/ GIS) ක්‍රියාකාරකම් -**
  කෘෂිකර්මාන්තය, වැවිලි, පාරිසරික, ස්වභාවික සම්පත් කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන්හි යෙදවුම් සඳහා පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා ඡායාරූප හා UAV ඡායාරූප භාවිතයෙන් ව්‍යාපෘති හා උපදේශන සේවාවන් සිදුකිරීම. 2022-23 සඳහා විශේෂයෙන් හඳුනාගත් ව්‍යාපෘති වන්නේ ‘‘වන ආවරණ ආකාරය සිතියම් ගත කිරීම’’, වන හායනය අධීක්ෂණය කිරීම, තේ වගාවන් සිතියම් ගත කිරීම් හා අධීක්ෂණය, ‘‘විදුලිය බෙදාහැරීමේ ජාලය සකස් කිරීම’’ හා ‘‘වැසි ජලය ලබා ගැනීමේ ප්‍රදේශය ප්‍රශස්තිකරණය’’වේ.

- ඉහළ සමාජ ආර්ථික බලපෑමක් සහිත කාර්මික විසඳුම් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන ව්‍යාපෘති.

- ACCIMT ආයතනයේ විදුලිසැර වලින් ආරක්ෂාවීම හා අදාල කාර්යයන් අඛණ්ඩව සිදුකිරීම

- ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන, රොබොටික්, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ සංවේදන/GIS ක්ෂේත්‍රයන්හි අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්.

- ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් උපකරණවල දෝෂ පිළිසකර කිරීම හා යථා තත්වයට පත්කිරීම.

- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති හා තාරකා විද්‍යාව ජනප්‍රිය කරවීමේ ක්‍රියාකාරකම්.

- කාර්යසාධනය පරීක්ෂා කිරීම්/ සහතිකකරණය, ක්‍රමාංකනය.

- අති නවීන ඉලෙක්ට්‍රොනික පද්ධති, මැනුම් උපකරණ හා වෛද්‍ය උපකරණයන්හි දෝෂ හඳුනා ගැනීම හා උසස් දෘඩකාංග පිළිසකර කිරීම්. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක දුම්රිය එන්ජින් හා දුම්රිය වල ක්ෂුද්‍ර-සකසනය මත පදනම් වූ දෝෂ යථා තත්වයට පත්කිරීම සැලසුම් කරන ලද විශේෂ කාර්යයක් වේ.

- විශේෂ කෙටිකාලීන පුහුණු, පශ්චාත් උපාධි පුහුණු, විශේඥ මෙහෙයුම් හා වෙනත් ඒ හා සම්බන්ධ කාර්යයන් ලෙස ගගන විද්‍යා තාක්ෂණ, අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්, රොබොටික්ස් සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශයේ මානව සම්පත් ධාරිතා සංවර්ධනය කිරීම.

10. 2021 වසර සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඑම්ටී/සී/ඒසීසීඅයිඑම්ටී/එෆ්ඒ/2021 } ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජුලි 26 දින

සභාපති,

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් , ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරවිකිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරවිකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයනලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති, රීති, විධිවිධානවලට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේII පරිච්ඡේදයේ 13.3 වගන්තිය	වැඩ බැලීමේ පත්කිරීම් කළ යුත්තේ නිත්‍ය පත්කිරීම් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වන අතර තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම් නොපමාව සිදුකළයුතු වුවද තනතුරු 03 ක් සඳහා 2013 සහ 2015 වර්ෂවල සිට විගණිත දිනය වන 2022 මැයි 20 දක්වා වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබූ අතර පුරප්පාඩු පිරවීමට සඳහා නොහැකිවී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 අනෙකුත් කරුණු

(අ) වසර 02 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 2,290,168 ක් වූ ලැබියයුතු ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 02 කට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන පවතින රු. 4,110,264 ක වලනය නොවන තොග ආයතනයේ ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට හෝ පර්යේෂණ සඳහා අත්‍යාවශ්‍ය තොග හැර ඉතිරි තොග අවශ්‍යතාවයක් ඇති වෙනත් ආයතනයන්ට නියමිත ක්‍රමවේදයකට අනුව විකිණීමට හෝ පැවරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේශණ හා කැණීම් කටයුතු සඳහා ඡායා පිටපත් ලබාගැනීමේ අරමුණින් වටිනාකම රු. 10,564,677 ක් වූ නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණි. යානය මිලදී ගැනීමට පෙර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රු.110,322 ක වියදමක් දරා නිලධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණුවක්ද ලබාදී තිබූ අතර විගණිත දිනය වූ 2022 මැයි 25 වන විටත් අදාල යානය භාවිතයට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදා හැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් සඳහා වින නියෝජිත ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු නොකිරීම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබූ තලගල ප්‍රදේශයේ පිහිටි අක්කර 12 ක භූමිය 2019 වර්ෂයේ සිට ඌණ උපයෝජිතව පවතින අතර 2013 වසරේ සිට සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය 2022 වසර වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. එසේම මෙම ඉඩම ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය ආරම්භයේදී නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව තෝරාගෙන තිබූ හෝමාගම, පිටිපන පිහිටි අක්කර 10 ක් වූ ඉඩම වාටා වැටක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව නාගරික සංවර්ධන අධිකාරිය තෝරාගෙන තිබුණු අතර, වැට ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන්

ලබා දිය හැකිව තිබිය දී ඇප සුරක්ෂණයක් ද රහිතව මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.3,543,744 ම අදාළ ආයතනයට ගෙවා තිබූ අතර, නැවත මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ නමුත් වැට ඉදිකිරීම සඳහා ලබාදී තිබූ මුදල් ආපසු ලබා ගැනීමට ආයතනය අපොහොසත්ව තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මාණ්ඩලික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 45 ක් ද, මාණ්ඩලික නොවන මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 18 ක් හා අනෙකුත් කාර්යය මණ්ඩල තනතුරුවල පුරප්පාඩු 12 ක් පැවතියද අදාළ බඳවා ගැනීම් විගණිත දිනය වන 2022 මැයි 25 දින වන විටත් සිදුකර නොතිබුණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

2.2.2 නීති, රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධාන වලට යොමුව

(අ) ආයතනයේ 2013 වසරේ සිට මේ වන තෙක් පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබෙන තනතුරු සංඛ්‍යාව 2කි. එම තනතුරු දෙක අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්) සහ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) වේ. 2013 වසරේ සිට වැඩ බලන පත්වීම් ලබා දී ඇති අතර, එම තනතුරු වලට පූර්ණ කාලීන නිලධාරීන් පත් කිරීම සඳහා 2016, 2017, 2019, 2020 සහ 2021 වසර වල පුවත්පත් දැන්වීම් පල කර ප්‍රයත්නයක් දරන ලදි. පුවත්පත් දැන්වීමට අනුව සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබීම හේතුවෙන්, මෙම වැඩ බලන තනතුරු සඳහා පූර්ණ කාලීන නිලධාරීන් පත් කිරීමට මේ වනතෙක් අපොහොසත් වී ඇත.

ආයතනයේ නිලධාරීන්ට මෙම වැඩ බලන පත්වීම් සම්බන්ධයෙන් අමතර දීමනාවක් ලබාදීමක් සිදු නොවන බැවින්, මේ සම්බන්ධයෙන් අමතර පිරිවැයක් වැයවී නොමැත.

තවද සේවක පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය මගින් 2022.06.01 දිනැති අංක MSTR/4/1/R&PROVolIii දරණ ලිපියෙන් අප ආයතනය වෙත මෙතෙක් පත්වීම් කර නොමැති සේවක බඳවා ගැනීම් කල් තබා, දැනට සේවයේ යෙදි සිටින නිලධාරීන්ගෙන් අදාළ කාර්යයන් සිදුකර ගැනීමට කටයුතු කරන මෙන් දන්වා ඇත.

2.3 අනෙකුත් කරුණු

(අ) විගණන නිරීක්ෂණයේ සඳහන් 2019 වර්ෂයට අදාළ ඉන්වොයිසි අතුරෙන් ඉන්වොයිසි අංක 5315 උපුල් කරුණාතිලක යන අය සඳහා නිකුත් කරන ලද රු.23,000/- ක ඉන්වොයිසිය 2022/03/22 දින අදාළ අංශයේ ඉල්ලීම පරිදි අවලංගු කර ඇති අතර අනෙකුත් ඉන්වොයිසි සඳහා 2020 වර්ෂයේදී අවස්ථා 4කදී සිහි කැඳවීම් සිදුකර ඇති අතර අදාළ අංශ මගින් ද එම දැනුවත් කිරීම සිදු කර ඇත.
එසේම විගණන නිරීක්ෂණයේ සඳහන් 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ ඉන්වොයිසි වලින් වැඩි කොටස රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අගයන් වේ. එයින් වැඩි ප්‍රමාණයක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, දිවි නැගුම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය ආයතන වලින් අය විය යුතු අගයන් වේ.

මේ පිළිබඳ වරින් වර සිහි කැඳවීම් ලබා දුන්නද එයට සාර්ථක පිළිතුරු ලැබී නොමැත. දිවිනැගුම වැනි ඇතැම් ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක නොවන බැවින් හිඟ මුදල් අය කර ගැනීමේ උත්සාහය ව්‍යවර්ථ වී ඇත.
කෙසේ වෙතත් තව දුරටත් එම ශ්ෂයන් අය කර ගැනීම පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

(ආ) විගණන නිරීක්ෂණයේ සඳහන් තොග අයිතම වලින් වැඩි ප්‍රමාණයක් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ඉලෙක්ට්‍රොනික අයිතම වන අතර ඒවා ව්‍යාපෘතිවල ස්වභාවය අනුව කාලයෙන් කාලයට භාවිතයට ගැනීමේ අවශ්‍යතාවන් මතුවේ. එමෙන්ම එකී ඉලෙක්ට්‍රොනික අයිතම විවෘත වෙළඳ පොලෙන් සෘජුව මිලදී ගැනීමට හැකියාවක් පවත්නා ආර්ථික අර්බුද තත්වය මත නොමැති වී ඇත. එමනිසා සංවර්ධන සහ පර්යේෂණ අවශ්‍යතා අනුව තොග අයිතම පවත්වාගැනීම හේතුවෙන් සමස්ථ තොග වටිනාකම ඉහල අගයක් ගෙන ඇත. එහෙත් විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි දිගු කාලයක් චලනය නොවන තොග අයිතම් හඳුනා ගෙන ඒවා ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඇ) වර්ෂ 2015 වන විට UAV තාක්ෂණය ලෝකයේ බොහෝ රටවල කෘෂිකර්මය, නගර සැලසුම්කරණය, මිනුම් සහ සිතියම්කරණය, පුරාවිද්‍යා ආදී විවිධ ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රශස්ථ ලෙස භාවිතා වුවත් ඒ වන විට ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා UAV තාක්ෂණය භාවිතය ඉතා අවම මට්ටමක පැවති නිසා මෙම නව තාක්ෂණය ඉහත ක්ෂේත්‍රවල දුරස්ථ සංවේදන සහ භූගෝලීය දත්ත පද්ධති (RS/GIS) ව්‍යාපෘති සඳහා හඳුන්වා දීමට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව අපගේ තාක්ෂණික කාර්ය මණ්ඩලය, මෙම නව UAV තාක්ෂණය භාවිතා කිරීමේ විභවයක් සහිත තෝරාගත් රාජ්‍ය ආයතන කිහිපයක ව්‍යාපෘති සඳහා එම තාක්ෂණ භාවිතයේ හැකියාව පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල දුරස්ථ සංවේදන දත්ත උපයෝගී කර ගනු ලබන විවිධ ව්‍යාපෘති සඳහා භාවිතාවන මිල අධික අධි-විභේදනකින් (high resolution) යුත් චන්ද්‍රිකා ඡායාරූප සඳහා ආදේශකයක් ලෙස ඡායාරූප ලබා ගත හැකි UAV යානයක් වර්ෂ 2016 දී මිලදී ගැනීමට ආයතනය තීරණය කරන ලදී.

අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මේ සඳහා තෝරාගනු ලැබූ එක්සත් රාජධානියේ Questuav Ltd සමාගම මගින් නිෂ්පාදිත Q-200 AGRI PRO UAV යානය පියාසර කිරීම සඳහා නිෂ්පාදකයා විසින් නිර්දේශ කරන ලද ආරක්ෂිත පියාසර උස මීටර් 122 (අඩි 400) ක් වේ.

ඉහත සඳහන් තාක්ෂණික භාවිතයන් සඳහා යොදාගැනීම පිණිස මෙම යානය ආනයනය කිරීමේදී ලබාගත යුතුව තිබූ අනුමැතීන් වන ආරක්ෂක අමාත්‍යාංශය අනුමැතිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමේ අනුමැතිය සහ ආනයන අපනයන පාලන අනුමැතිය යන අනුමැතීන් විධිමත් ලෙස ලබා ගන්නා ලදී. ආරක්ෂක අමාත්‍යාංශය එය පියාසර කිරීමේ දී මීටර් 150 ක(අඩි 492) උපරිම පියාසර උසකට යටත්ව ආනයනය කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. තව ද UAV යානය පියාසර කිරීමට පෙර එසේ පියාසර කරන එක් එක් අවස්ථාවේදී ඒ පිළිබඳව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියාට (OCDS) දන්වා එකී එක් එක් පියාසර මෙහෙයුම සඳහා වෙන් වෙන් වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙතින් අවසර ලබාගත යුතු බව ද දැනුම් දෙන ලදී.

වර්ෂ 2016 අගෝස්තු මාසයේ සිට විවිධ අවස්ථාවලදී UAV යානය ඉහත සඳහන් භාවිතයන් සඳහා පියාසර කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අවසර ඉල්ලූ අතර එම සෑම අවස්ථාවකදී ම ගුවන් යානය ආරක්ෂිතව පියාසර කිරීම සඳහා නිර්දේශිත උස වන මීටර් 122 ට (අඩි 400) වඩා අඩු මීටර් 60 (අඩි 200) ක උපරිම සීමාවක් සඳහා පමණක් අවසර දෙන ලදී. එසේම, එම කිසිදු අවස්ථාවක දී එසේ මීටර් 60 (අඩි 200) ක උපරිම පියාසර උසක් සඳහා පමණක් අවසර ලබාදීම සම්බන්ධයෙන් පිළිගත හැකි තාක්ෂණික හේතුවක් අප ආයතනය වෙත දැනුම් දී නැත. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අවසර ලබා දුන් මෙම මීටර් 60 ක පියාසර උස මෙබඳු UAV යානයක් ආරක්ෂිතව ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර මෙම UAV

තාක්ෂණය ප්‍රශස්ථ ලෙස භාවිතා කරන විදේශීය රටවල මෙම සීමාව සාමාන්‍ය වාණිජ භාවිතයන් සඳහා මීටර් 122 (අඩි 400) ක් වේ.

මෙලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් UAV යානයේ පියාසර උස සීමා කිරීම නිසා එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි වී ඇත.

ශ්‍රී ලංකාව තුළ UAV තාක්ෂණය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා එම තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති ACCIMT ආයතනය විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත ලබාදිය හැකි තාක්ෂණික දායකත්වය පිළිබඳ විශේෂ සාකච්ඡාවක් එම අධිකාරිය සමඟ පවත්වන ලද අතර, අනතුරුව මෙම පියාසර උස පිළිබඳ ගැටලූ නිරාකරණය කර දෙන ලෙස විශේෂ ඉල්ලීමක් ද කරන ලදී. එසේ වුවද, මෙම පියාසර උස පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී පසු විපරම් කළත් එම අධිකාරියෙන් මේ දක්වා අප වෙත යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත.

මේ වනවිට ආයතනයේ සන්නිවේදන අංශය(communication division) දේශීයව UAV යානා, ආරක්ෂක අංශවල අවශ්‍යතාවලට අනුව සැලසුම් කර නිර්මාණය කිරීම පිළිබඳව සහ UAV මෙහෙයුම් පිළිබඳව වැඩි නිපුණතාවයක් ලබා ඇති බැවින් මෙම UAV යානය 2020 ජූලි මාසයේදී එම අංශය වෙත භාර දෙන ලදි. ඉදිරියේදී මෙම UAV යානය ආරක්ෂක අංශවල ව්‍යාපෘති සඳහා සහ UAV යානා පියාසර කිරීම පිළිබඳ ආරක්ෂක අංශ නිලධාරීන් පුහුණු කිරීම සඳහා භාවිතා කිරීමට ආයතනය බලාපොරොත්තු වේ. එමෙන්ම ඉහත කී ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ තවදුරටත් කටයුතු කිරීමට ආයතනය අපේක්ෂා කරයි.

(ඇ) නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) විසින් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබා ගැනීම සහ නැවත බෙදාහැරීමේ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් සඳහා 2013 වර්ෂයේ දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව සඳහා සුදුසු පාර්ශවයකින් විදේශ මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාව සොයා බැලීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර එය සාර්ථක නො වූ බැවින් සුදුසු පරිදි විදේශීය පාර්ශවයක් මේ සඳහා සම්බන්ධ කර ගැනීමට ඇති හැකියාව සොයා බලන ලෙස ආයතනයට උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව ACCIMT ආයතනය විසින් චීනයේ අභ්‍යවකාශ තොරතුරු පර්යේෂණ ආයතනය (AIR-CAS, අතීතයේ RADI) සමඟ සාකච්ඡා කර ඔවුන් මෙම චන්ද්‍රිකා මධ්‍යස්ථානයේ සහයෝගී හවුල්කරු ලෙස කටයුතු කිරීමට එකඟ කර ගැනීම ට සමත් විය. එම ආයතනය සමඟ ඇති කරගත් මූලික අවබෝධතා ගිවිසුමට අනුව, AIR-CAS ආයතනය විසින් චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා තාක්ෂණික උපකරණ සැපයීම, මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සහ ACCIMT ආයතනයේ ඉංජිනේරුවන්ට පුහුණුව ලබා දීමත් ACCIMT ආයතනය විසින් ඉඩම, චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, වෙබ් අඩවියේ යටිතල පහසුකම් සහ චන්ද්‍රිකා මධ්‍යස්ථානයේ තාක්ෂණික ක්‍රියාකාරිත්වය ලබා දීමටත් එකඟ විය.

2016 වර්ෂයේ දී මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ යෝජිත තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ විද්‍යා හා තාක්ෂණ ආයතන විශ්ව විද්‍යාල ඇතුළු ආයතන සමූහයකට නව පහසුකම් ඉදි කිරීම සඳහා ඉඩම් වෙන් කිරීමට නියමිතව තිබූ අතර ඒ සඳහා හෝමාගම පිටිපන ප්‍රදේශයේ හඳුනාගෙන තිබූ මාහේන්වත්ත ඇතුළු ඉඩම් කිහිපයකින් ඉඩම් අත්පත් කර ගනිමින් තිබුණි. මෙහිදී

මාහේන්වත්තෙහි අක්කර 10 ක ඉඩමක් මෙම චන්ද්‍රිකා මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වෙන් කරන ලදි. එම ඉඩම නිශ්චිත වශයෙන් මායිම් වෙන්කර නොතිබූ බැවින් ඉඩම මිනින්දෝරු කර එහි මායිමේ ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා එකී සම්බන්ධීකරණය සිදු කරන ලද ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වෙත භාර දෙන ලදී. මෙම කාර්යය වෙනත් ආයතනයක් මගින් ඉටු කර ගැනීම කිසිසේත් ප්‍රායෝගික නොවූ බැවින් වැට ඉදි කිරීමේ කාර්යය සඳහා ගත හැකි ප්‍රශස්ථම තීරණය වූයේ එය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දීමයි.

මේ අතරතුර, ආතර් සී ක්ලාක් ආයතනයට ආරම්භයේදී ලබා දී තිබූ මාහේන්වත්ත තුළ පිහිටි ඉහත ඉඩම වෙනුවෙන් විකල්ප ස්ථානයකින් ඉඩමක් ලබා දෙන ලෙසත් ඉහත වෙන් කරන ලද ඉඩම ජාතික විද්‍යා පදනම මඟින් ඉදිකිරීමට යෝජිතව තිබූ ජාතික විද්‍යා මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලෙසත් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ලදී.

ඉන් අනතුරුව වර්ෂ 2018 දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රජයට පවරාගනු ලබන පාදුක්ක, හොරගල ප්‍රදේශයේ ඉඩමකින් අක්කර 15 ක් මෙම චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා වෙන් කිරීමට එකඟ වූ අතර පෙර ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරියට භාර දෙන ලදි. හොරගල ප්‍රදේශයේ ඉඩම අත්පත් කර ගැනීමේදී ඇති වූ මහජන විරෝධතාවය නිසා වර්ෂ 2019 දී නැවත හෝමාගම තලගල ප්‍රදේශයේ ‘‘තලගලවත්ත’’ ඉඩමෙන් චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා අක්කර 12 ක නව ඉඩමක් වෙන් කරන ලදි.

මෙලෙස අවස්ථා කිහිපයකදී චන්ද්‍රිකා මධ්‍යස්ථානය සඳහා වෙන්කළ භූමිය වෙනස් කිරීම හේතුවෙන්, මුල් ඉඩම වටා වැටක් ඉදිකිරීම සඳහා UDA ආයතනයට ගෙවන ලද එම මුදල නැවත ACCIMT ආයතනය වෙත ලබා දෙන ලෙස UDA ආයතනය වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත.

ශ්‍රී ලංකාවට චන්ද්‍රිකා දත්ත ලබාගැනීම සම්බන්ධයෙන් AIR-CAS ආයතනය සමග පැවති මූලික සාකච්ඡා වලදී ඔවුන්ගේ GF-1 ශ්‍රේණියේ චන්ද්‍රිකා දත්ත ශ්‍රී ලංකාවට සැපයීමට එකඟ විය. තවද මෙම ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය ලබාදීමේදී එම අනුමැතිය තුළ අන්තර්ගත වූ එක් කොන්දේසියක් වූයේ අදාල එකඟතාවය යටතේ AIR-CAS ආයතනය මගින් ආතර් සී. ක්ලාක් ආයතනය වෙත ලබාදීමට අපේක්ෂිත GF1 ශ්‍රේණියට අයත් සිවිල් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා පද්ධතිය ඔස්සේ ලබාදෙන පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්තවලට වැඩිමනත් වශයෙන් චීන රජයට අයත් අනෙකුත් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා අයත් ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන, ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් විය හැකි වෙනත් සිවිල් පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා පද්ධතීන්ගෙන් ලබාගන්නා දත්ත, මෙම පෘථිවි මධ්‍යස්ථානය ඔස්සේ ශ්‍රී ලංකාව වෙත නොමිලේ ලබාගැනීම සඳහා චීනයේ අදාල ආයතන සමග සාකච්ඡා ආරම්භ කිරීමයි. මේ අනුව, ACCIMT ආයතනය විසින් අමාත්‍යාංශය අමතා රාජ්‍යතාන්ත්‍රික නාලිකා හරහා වැඩි විස්තරයකින් යුත් චීනයේ GF-2 සහ GF-3 චන්ද්‍රිකා දත්ත ලබා ගැනීමේ හැකියාව සොයා බලන ලෙස ලිඛිත ඉල්ලීමක් වර්ෂ 2021 දී ඉදිරිපත් කරන ලදි. මේ අනුව 2022 වර්ෂයේ මාර්තු මාසයේ දී විදේශ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහභාගීත්වයෙන් AIR-CAS ආයතනය සමග Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡාවක් පවත්වන ලදි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2022 අප්‍රේල් මාසයේදී AIR-CAS ආයතනය විසින් මූලික දත්ත තත්ත්ව තක්සේරුව සඳහා GF-1, GF-2 සහ GF-3 චන්ද්‍රිකා මගින් ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි ලබා ගත්

නියදි දත්ත කිහිපයක් අප වෙත ලබා දී ඇත. ආයතනයේ විද්‍යාඥයින් විසින් මෙම දත්ත විශ්ලේෂණය කර වාර්තාවක් ලබා දී ඇති අතර මේ පිළිබඳව AIR-CAS ආයතනය සමඟ සාකච්ඡා කරමින් පවතී.

(ඉ) 2021.11.23 දින මාණ්ඩලික මට්ටමේ තනතුරු පිරවීම සඳහා පුවත්පත් දැන්වීමක් පල කරන ලදි. ඒ සඳහා HM 1-3 සහ AR 1 ගණය සඳහා පමණක් සුදුසුකම් ලත් අයදුම්පත් ලැබී තිබුණු අතර සුදුසුකම් ලත් අයදුම්පත් මඟින්, 2021 පෙබරවාරි මස 10, 11 සහ 12 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුරද, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ

එක් තනතුරක්ද, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු එක් තනතුරක්ද, පර්යේෂණ ඉංජිනේරුවන් තිදෙනෙකු, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන් තිදෙනෙකු, පද්ධති ඉංජිනේරුවන් එක් තනතුරක්ද, මෘදුකාංග ඉංජිනේරුවන් දෙදෙනෙක්ද, සහ පර්යේෂණ විද්‍යාඥ දෙදෙනෙක්ද ආයතනයට බඳවා ගන්නා ලදි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා සංවර්ධන), අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්), අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), ජ්‍යෙෂ්ඨ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන්, ජ්‍යෙෂ්ඨ පද්ධති ඉංජිනේරුවන් සහ AR 2 ගණයට අයත් ඉංජිනේරුවන් සඳහා සුදුසුකම් ලත් අයදුම්පත් නොලැබුණි.

නැවතත් 2021.01.27, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා සංවර්ධන), අධ්‍යක්ෂ (අභ්‍යාවකාශ තාක්ෂණ හා යෙදවුම්), අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) ජ්‍යෙෂ්ඨ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ පද්ධති ඉංජිනේරු සහ AR 2 ගණයට අයත් ඉංජිනේරුවන් සඳහා පුවත්පත් දැන්වීමක් පල කල අතර ඒ සඳහා ද, සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබුණි.

2020.11.23 දිනැති පුවත්පත් දැන්වීමේ පල වූ වැඩ අධිකාරී (MA 2-2), පොත් තබන්නා සහ ඉංජිනේරු සහකාර තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්පත් ලැබී තිබූ අතර, එම තනතුරු පිරවීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර තිබුන අතර, එවකට තිබූ Covid - 19 වසංගතය හේතුවෙන්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට බාධා පැමිණි අතර, ඉන්පසු බඳවා ගැනීම් තාවකාලිකව නතර කිරීම සඳහා මහා භාණ්ඩාගරයෙන් චක්‍රලේඛයක් ලැබීම හේතුවෙන්, එම බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය.

තවද, මෙම බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස 2022.03.09 දිනෙන් සහ 2022.03.28 දිනෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට ලිපි යොමු කර ඇත.

අනෙකුත් කාර්ය මණ්ඩලයට අයත් රියදුරු සහ කාර්යාල සහායක තනතුරු බඳවා ගැනීම සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් බඳවා ගැනීම් සිදුකර ගැනීම සඳහා 2022.03.18 දිනෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට ලිපියක් යොමු කර ඇත.

මාණ්ඩලික නොවන සහ අනෙකුත් කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීම සිදුවනුයේ සියළුම මාණ්ඩලික මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමෙන් අනතුරුවය.

තාක්ෂණ ගණයේ ඉහළ තනතුරු සඳහා රජය විසින් අනුමත කර ඇති වැටුප් පරිමාන වර්තමානයේ වෙළඳ පොලේ පවතින වැටුප් හා සැසඳීමේදි පහළ අගයක පවතින බැවින් එම තනතුරු සඳහා අයදුම්පත් නොලැබීම නිරීක්ෂණය වේ.

තවද සේවක පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය මගින් 2022.06.01 දිනැති අංක MSTR/4/1/R&PROVolIii දරණ ලිපියෙන් අප ආයතනය වෙත මෙතෙක් පත්වීම් කර නොමැති සේවක බඳවා ගැනීම් කල් තබා, දැනට සේවයේ යෙදි සිටින නිලධාරීන්ගෙන් අදාළ කාර්යයන් සිදුකර ගැනීමට කටයුතු කරන මෙන් දන්වා ඇත.

අත්සන් කලේ,
ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

Arthur C Clarke Institute for Modern Technologies

Katubedda, Moratuwa, 10400, Sri Lanka

Email us : info@accmt.ac.lk

Call us (General) Telephone : +94-0 11-2650569, +94 011-2650838

Fax : +94-11-2650462

www.accimt..ac.lk